**ලංකා බැංකුව හා එහි පරිපාලිත සමාගම් - 2020**

-----------------------------------------------------------

## 1.1 මතය

-----------

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත ලංකා බැංකුවේ ("බැංකුව") මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා එහි පරිපාලිත සමාගම්වල ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 5 (1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

------------------------

මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (SLAuSs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කරනු ලැබේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පාලනය කිරීම, සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

----------------------------------------------------------------------

සමස්තයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාගැනීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාවක්

නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ තහවුරුවක් යන්න, ඉහල මට්ටමේ, තහවුරුවක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයන් ක්‍රියාත්මක කිරීමේදී සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගැනීම සඳහා තහවුරුවක් නොවේ. සාවද්‍ය ප්‍රකාශන වංචා හෝ වැරදි හේතුවෙන් පැන නැගිය හැකි අතර එය තනිවම හෝ සමස්තයක් ලෙස ගත්කල ප්‍රමාණාත්මක ලෙස සැලකේ නම්, භාවිතා කරන්නන්ට මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්ව ආර්ථික තීරණ ගැනීම සඳහා බලපානු ලබන බවට සාධාරණව අපේක්ෂා කළ හැකිය.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනයේ කොටසක් ලෙස සමස්ත විගණනය තුළ මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබාවය පවත්වා ගෙන යන ලදී. එසේම මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ එම අවදානම්වලට ප්‍රතිචාර දක්වන විගණන පරිපාටි සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ප්‍රමාණාත්මක සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම. වංචාවල ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් සොයා නොගැනීම වැරදි හෙළිදරව් නොකිරීමට වඩා වැඩි අවදානමකට හේතු වන අතර දුස්සන්ධානය, කූට රචනය, අභිප්‍රායික අත්හැරීම්, වරදවා දැක්වීම් හෝ අභ්‍යන්තර පාලනය අක්‍රීය කරන වංචා, මෙයට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විගණනයට අදාළවන අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා නමුත් සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකෙරේ.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- අඛණ්ඩ පැවැත්ම පදනම් කරගත් ගිණුම්කරණය පිළිබඳ කළමනාකරණයේ යොදාගැනීම පිළිබඳ අදාළත්වය නිගමනය කිරීම සහ ලබාගත් විගණන සාක්ෂි පදනම් කරගෙන, අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වා ගෙන යාමට සමූහයේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයකට හේතුවන සිද්ධිවලට හෝ කරුණුවලට අදාළවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින්නේද යන්න නිගමනය කිරීම. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධි හෝ තත්වයන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම නතර කිරීමට හේතු විය හැක.
- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය හා අන්තර්ගතය ඇගයීම සහ සාධාරණ ඉදිරිපත් කිරීම ඉටු කරගැනීමට පාදක වූ ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශනවලින් නියෝජනය වේද යන්න ඇගයීම.
හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමූහය කටයුතු කර ඇති බව; සහ

- සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **මූල්‍ය ප්‍රකාශන**

**1.5.1** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (i) | සාමූහික හානිකරණය ගණනය කිරීම සඳහා බැංකුව මෘදුකාංගයක් මිල දී ගෙන තිබුණද, පැහැර හැරීමකදී නිරාවරණය වීම (ඊ.ඒ.ඩී) සහ අපේක්ෂිත ණය පාඩු (ඊ.සී.එල්) ගැලපීම තවමත් අතින් සිදු කරයි. | පද්ධති ක්‍රියාත්මක කිරීම ආරම්භක සජීවී ධාවන තත්වයෙන් වන බැවින් සමාන්තර ධාවනයක් ලෙස අපි අතින් සහ පද්ධතිය හරහාද ගණනය කිරීම් සිදු කරයි. පද්ධති ගණනය කිරීම් සමඟ අප හුරුවූ විට, අතින් ගණනය කිරීම් නවතා දමනු ලබයි. | කිසිදු අතින් ගණනය කිරීමක් සඳහා මැදිහත් වීමකින් තොරව පද්ධතිය හරහා ඊ.ඒ.ඩී සහ ඊ.සී.එල් ගණනය කිරීම් සිදු කිරීමට නිර්දේශ කෙරේ. |
| (ii) | නියමයන් වෙනස් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දීර්ඝ කිරීම, ගෙවීම් කල් දැමීම, එකඟතාවයන් අත්හැරීම් (නැවත සකසන ලද හා ප්‍රතිව්‍යුහගත) ඇතුළු සහන, ණය සහ අත්තිකාරම් " අදියර 3 " යටතේ හඳුනා ගත යුතු වුවත්, මූලික බැංකු පද්ධතිය තුළ ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් ග්‍රහණය කර ගැනීම සඳහා බැංකුව සතුව කිසිදු යාන්ත්‍රනයක් නොමැත. 2018 දෙසැම්බර් 31 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - එස්.එල්.එෆ්.ආර්.එස් 09 අනුගමනය කර ගැනීම පිළිබඳ බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශයට අනුව බැංකුවේ හානිකරණ ප්‍රතිපාදන ගණනය කිරීමේදී එවැනි ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් සලකා බැලීමට ක්‍රමයක් නොමැත. | ප්‍රතිව්‍යුහගත පහසුකම් හඳුනාගැනීමේ යාන්ත්‍රණය සංවර්ධනය කර හඳුන්වා දී ඇත. | බැංකුව තුළ ප්‍රතිව්‍යුහගත ණය ග්‍රහණය කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීමට සඳහා නිර්දේශ කෙරේ. |
| (iii) | තත්‍ය අලාභ ලබා දුන් පැහැර හැරීම් අනුපාත (එල්.ජී.ඩී) භාවිතා කිරීම වෙනුවට ක්‍රෙඩිට් කාඩ් සහ අයිරා පහසුකම් සඳහා බැංකුව සියයට 45 ක පාඩු අනුපාතයක් සලකා බලා ඇත. | තත්‍ය එල්.ජී.ඩී ගණනය කිරීම සඳහා දත්ත නොමැති වීම හේතුවෙන් බැංකුව ක්‍රෙඩිට් කාඩ් සහ අයිරා පහසුකම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොමු කරන ලද සියයට 45 ක එල්.ජී.ඩී භාවිතා කරයි. මේ සඳහා අවධානය යොමු කර ඇති අතර පවතින දත්ත සලකා බලා සුදුසු ආකෘතියක් සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. | තත්‍ය අලාභ ලබා දුන් පැහැර හැරීම් අනුපාත (එල්.ජී.ඩී) භාවිතා කිරීම වෙනුවට ක්‍රෙඩිට් කාඩ් සහ අයිරා පහසුකම් සඳහා බැංකුව සියයට 45 ක පාඩු අනුපාතයක් සලකා බලා ඇත. |

| | | | |
|---|---|---|---|
| (iv) | නිරන්තර පදනමින් සම්බන්ධතා නිලධාරීන් විසින් සපයනු ලබන මුදල් ප්‍රවාහ පුරෝකථන අවම වශයෙන් මාසිකව/කාර්තුමය/වාර්ෂිකව පසු පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් කළමනාකරණය ක්‍රියාත්මක කළ යුතුය. පසු පරීක්ෂාව යනු පුරෝකථන සාක්ෂාත් කර ගත් ප්‍රතිඵල සමඟ සැසඳීමයි. සාක්ෂාත් කර ගත් අගයන්ට එරෙහිව පුරෝකථනයන් සංසන්දනය කිරීම මත පදනම් වූ ආකෘතියක කිසියම් වලංගු භාවයක් වෙත යොමු කිරීමට පසු පරීක්ෂාව භාවිතා වේ. ඊට අදාළව, කළමනාකාරිත්වය විසින් පෙර කාලපරිච්ඡේදවලදී සපයන ලද මුදල් ප්‍රවාහයන් බැංකුව වෙත ලද තත්‍ය මුදල් ප්‍රවාහයන් සමඟ සැසඳිය හැක. විචලනයන් පවතී නම්, වත්මන් වර්ෂයේ හානිකරණ ගණනය කිරීමේ අරමුණු සඳහා සම්බන්ධතා නිලධාරීන් විසින් සපයනු ලබන මුදල් ප්‍රවාහ පුරෝකථනවල 'දෝෂ අනුපාතය' සඳහා ගැලපීම් සිදු කළ යුතුය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. සෑම කාර්තුවක් අවසානයේම, පුරෝකථනය කරන ලද අපේක්ෂිත මුදල් ප්‍රවාහවල විශ්වසනීයත්වය පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට සහ මුල් ඇස්තමේන්තුවල යම් වෙනසක් සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට සම්බන්ධතා නිලධාරීන්ට/ණය නිලධාරීන්ට පවරා ඇත. | නිරන්තර පදනමින් සම්බන්ධතා නිලධාරීන් විසින් සපයනු ලබන මුදල් ප්‍රවාහ පුරෝකථන අවම වශයෙන් මාසිකව/කාර්තුමය/වාර්ෂිකව පසු පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් කළමනාකරණය ක්‍රියාත්මක කළ යුතුය. පසු පරීක්ෂාව යනු පුරෝකථන සාක්ෂාත් කර ගත් ප්‍රතිඵල සමඟ සැසඳීමයි. සාක්ෂාත් කර ගත් අගයන්ට එරෙහිව පුරෝකථනයන් සංසන්දනය කිරීම මත පදනම් වූ ආකෘතියක කිසියම් වලංගු භාවයක් වෙත යොමු කිරීමට පසු පරීක්ෂාව භාවිතා වේ. ඊට අදාළව, කළමනාකාරිත්වය විසින් පෙර කාලපරිච්ඡේදවල දී සපයන ලද මුදල් ප්‍රවාහයන් බැංකුව වෙත ලද තත්‍ය මුදල් ප්‍රවාහයන් සමඟ සැසඳිය හැක. විචලනයන් පවතී නම්, වත්මන් වර්ෂයේ හානිකරණ ගණනය කිරීමේ අරමුණු සඳහා සම්බන්ධතා නිලධාරීන් විසින් සපයනු ලබන මුදල් ප්‍රවාහ පුරෝකථනවල 'දෝෂ අනුපාතය' සඳහා ගැලපීම් සිදු කළ යුතුය. |
| (v) | අයි.එෆ්.ආර්.එස් ගැලපීම සඳහා බැංකුව මාස 3 ක් දක්වා පොලී ආදායම පමණක් හඳුනාගන්නා අතර, Kalypto පද්ධතිය භාවිතා නොකර බැංකුව මෙම ගැලපීම අතින් ගණනය කර ඇති බව නිරීක්ෂණය විය. | බැංකුවේ අනුමත ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, බැංකුව මාස 3ක් දක්වා පොලිය හඳුනාගන්නා අතර, හානිකරණය ගණනය කිරීම් සඳහාද එය ඇතුළත් කර ඇත. කෙසේ වෙතත්, දැනට මෙම ක්‍රියාවලිය අතින් හසුරුවන අතර ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමේ හැකියාව සොයාබැලීම සඳහා පද්ධති | අයි.එෆ්.ආර්.එස් ගැලපුම අනුව ආදායම් ප්‍රකාශනයට පොලී ආදායම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | | සැපයුම්කරු සමඟ මෙම කරුණු සාකච්ඡා කරනු ඇත. | |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමහර පද්ධති අසාර්ථක වීම් හේතුවෙන් පොදු ලෙජර් ශේෂය සහ බැංකු වෙළඳ මූල්‍ය පද්ධතියේ හිඟ ශේෂයන් අතර රු.397,565,454 ක වෙනසක් වාර්තා විය. | 2006 වසරේ සිට මෙම දිගුකාලීන හිඟ ශේෂ අයිතමයන් වාර්තා වී ඇත. බැංකුව මෙම අයිතමයන් සංසන්දනය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටින අතර එක් එක් අයිතමයන් එක් එක් සිද්ධිය අනුව සංසන්දනය කිරීමට අවශ්‍ය වේ. එබැවින් මෙම කාර්යය සඳහා දීර්ඝ කාලයක් අවශ්‍ය වනු ඇත. තවද, බැංකුව විසින් මෙම ගිණුම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඒ අනුව සිදු කර ඇත. | පොදු ලෙජරය සහ උපපද්ධති අතර ශේෂයන් අඛණ්ඩ පදනමින් සංසන්දනය කිරීමට නිර්දේශ කෙරේ. |
| (ii) | ඒ.එම්.ටී රෙක් ගෙවීම් පොදු ලෙජර ශේෂය සහ ට්.සී.එල් සාරාංශ පත්‍ර ශේෂය අතර රු.4,163,088 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. වෙනස්කම් ඇතිවීමට හේතුව හඳුනා ගැනීමට පියවර ගන්නා අතර යම් වෙනසක් ඇත්නම් අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ඒ.එම්.ටී රෙක් ගෙවීම් පොදු ලෙජර ශේෂය සහ ට්.සී.එල් සාරාංශ පත්‍ර ශේෂය අතර වෙනස නිවැරදි කිරීමට නිර්දේශ කෙරේ. |
| (iii) | මාලදිවයින ශාඛාවට අදාළව ට්.සී.එල් සාරාංශ වාර්තාව සහ හානිකරණ ගණනය කිරීමේ පත්‍රය අතර රු.236,941,644 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදි. වෙනස්කම් තිබේ නම් එයට හේතුව හඳුනා ගැනීමට අපි මාලදිවයින ශාඛාව සමඟ අවශ්‍ය සංසන්දනයන් සිදු කරනු ලබන අතර යම් වෙනසක් තිබේ නම් නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | මාලදිවයින ශාඛාව සම්බන්ධයෙන් ට්.සී.එල් සාරාංශ වාර්තා ශේෂය සහ හානිකරණ ගණනය කිරීමේ පත්‍ර ශේෂය අතර ඇති වෙනස්කම් නිවැරදි කිරීමට නිර්දේශ කෙරේ. |

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 දෙසැම්බර් 31 දිනට තලාව, ආයතනික ශාඛාව, වැල්ලවාය, මෙට්‍රොපොලිටන් හා මතුගම ශාඛාවල පිළිවෙලින් රු.10,698,567, රු.96,519, රු.5,533,144, රු.1,731,086 සහ රු.2,354,000 ක දීර්ඝ කාලයක් හිඟව පවතින අවිනිශ්චිත ගිණුම් ණයගැති ශේෂයන් | <u>තලාව ශාඛාව</u><br>තලාව ශාඛාවේ රු. 10,698,567 ක රක්ෂණ හිමිකම් ලැබී ඇති අතර නීතිමය අදහස් ඉල්ලා සිටීමෙන් අනතුරුව ශාඛාව ඒ අනුව කටයුතු කරමින් සිටී. නීතිමය අදහස් දැක්වීම | දිගුකාලීන හිඟ අවිනිශ්චිත ගිණුම් ණයගැති ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | නිරීක්ෂණය විය. වසර 03 කට වඩා වැඩි කාලයක සිට එම ශේෂයන් එම ගිණුම් තුළ පවතින අතර අදාළ ශාඛා මගින් දිගුකාලීන හිඟ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවසන් වූ පසු, ශාඛාව හිඟ ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br><u>ආයතනික ශාඛාව</u><br>චයිනා නැෂනල් ඒරෝ ටෙක්නොලොජී ඉංජිනියරින් කෝපරේෂන් ගිණුම (ගිණුම් අංක. 71069025) හර කිරීම මගින් ආර්. එච්. සී. ප්‍රසංග මහතා වෙනුවෙන් 2016.04.08 වැනි දින අකුරැස්සේ අනෙකුත් බැංකු ශාඛාව වෙත කරන ලද ප්‍රේෂණය දෙවරක් සටහන් වීමෙන් ඇති වූ ස්ලිප් ගෙවීම් ද්විකරණය හේතුවෙන් මෙම හිඟ අයිතමය නිර්මාණය වී ඇත. මේ සම්බන්ධයෙන් ගණුදෙනුකරු හමුවීමට ශාඛාව කටයුතු යොදා ඇති අතර දෝෂය නිවැරදි කරනු ඇත.<br><u>වැල්ලවාය ශාඛාව</u><br>එච්/සී 142/2019 දරන උසාවියේ විභාග වෙමින් පවතින නඩුවක් පවතින බැවින් වැල්ලවාය ශාඛාවටට රු. 5,553,144 ක් ලැබීමට ඇත.<br><u>මෙට්රොපොලිටන්</u><br>රු.1,731,085 ක් කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර 2021.11.12 දින ගිණුම නිරවුල් කර ඇත.<br><br><u>මතුගම ශාඛාව-ඕ/එස්</u><br>මතුගම ශාඛාවට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකිවන පරිදි සිද්ධිය වූ කාලය තුළ අදාළ ගණුදෙනුකරු විදේශගතව සිටි බවට සාක්ෂි ලබා ගැනීම සඳහා පොලිස් පැමිණිල්ලක් ගොනු කර ඇත. ක්‍රියාමාර්ග ගැනීම එතෙක් නවතා ඇත. | |
| (ii) | අවිනිශ්චිත ගිණුම් ණයගැතියන් යටතේ වන ප්‍රධාන කාර්යාලයේ පරිපාලක සේවා ගිණුමේ ශේෂය රු. 11,139,311 ක් වන අතර එය වසර 1 සිට 3 දක්වා දිගුකාලීන හිඟ ශේෂයක් වේ. අදාළ බලධාරින් විසින් දීර්ඝ කාලීන හිඟ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ලියකියවිලි ලබා ගැනීමෙන් පසු බොහෝ ශේෂයන් 2021 දෙසැම්බර් 31 දිනට පෙර ආපසු හැරවිය යුතුය. | අවිනිශ්චිත ගිණුම් ණයගැතියන් යටතේ වන ප්‍රධාන කාර්යාලයේ පරිපාලක සේවා ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------------**

**1.6.1 ගෙවිය යුතු මුදල්**

**----------------------**

**විගණන නිරීක්ෂණය**

**-----------------------**

(i) අනෙකුත් වගකීම් යටතේ වර්ගීකරණය කර ඇති පහත ගිණුම් සැලකිය යුතු කාල පරිච්ඡේදයක සිට දිගුකාලීන හිඟ ශේෂයන් ලෙස පවති. දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අදාළ බලධාරීන් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එවැනි ශේෂයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පොදු ලෙජර ගිණුමේ නම<br>------- | පිරිවැය මධ්‍යස්ථානය<br>---------- | මුදල<br>-------<br>(රු.) | සටහන<br>------ |
|---|---|---|---|
| කලෙක්ෂන් එෆ්.එක්ස් වෙත යවා ඇති චෙක්පත් | 505 (වත්තල ශාඛාව) | 157,870 | මෙම ශේෂය මෙම ගිණුම යටතේ 2013 අගෝස්තු 15 සිට පවතින එක් ගණුදෙනුකරුවකුගේ ශේෂයකි. |
| හිමිකම් නොලත් ශේෂ ගිණුම | 726 (අක්වෙරළ බැංකු අංශය) | (617,924,477) | මෙම ශේෂය වසර 8ක කාලයක සිට මෙම ගිණුම යටතේ පවති. |
| සහභාගීත්ව නොබැඳි ගිණුම (Participation Off-Set) | 632 (<u>මාලදිවයින ශාඛාව)</u> | 56,061,368 | මෙම ශේෂය තහවුරු කිරීමට ලේඛන |

**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**

**------------------------------**

<u>කලෙක්ෂන් එෆ්.එක්ස් වෙත යවා ඇති චෙක්පත් (වත්තල ශාඛාව)</u>

වත්තල ශාඛාව අවශ්‍ය විධිවිධාන සම්පූර්ණ කිරීමෙන් පසු එම ශේෂය කපා හැරීමට කටයුතු කරමින් සිටී.

<u>හිමිකම් නොලත් ශේෂ ගිණුම (අක්වෙරළ බැංකු කටයුතු)</u>

ඉරාන සම්බාධක හේතුවෙන් ගිණුම තවදුරටත් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් අදාළ අනුමැතිය ඇතිව හිමිකම් නොලත් ශේෂ ගිණුමකට ශේෂය මාරු කරන ලදී.

<u>සහභාගීත්ව නොබැඳි ගිණුම (Participation Off-Set) මාලදිවයින ශාඛාව</u>

ජාතික ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය (එන්.එස්.එල්.එස්) යටතේ අදාළ සිසුන්ට ප්‍රදානය කරන ලද ණය මුදල සඳහා ඇපයක් ලෙස මාලදිවයින් රජය විසින් බැංකුවේ මාලදිවයින ශාඛාවේ පවත්වාගෙන යනු ලබන එකී යෝජනා ක්‍රමයේ අරමුදල් ගිණුමට (ගිණුම් අංක 6320128697) එම්.වී.ආර් මිලියන 10.0 ක තැන්පතු 2011.01.20 දින සිදු කර ඇත. "සහභාගීත්ව නොබැඳි ගිණුම" ලෙස එම අරමුදල් බෙදා හැරීම සඳහා වෙනම පොදු ලෙජර ගිණුමක් නිර්මාණය කර ඇත. එම ගිණුම කාලීන ණය එම්.වී.ආර් / යූ.එස්.ඩී (පොදු ලෙජර ගිණුම) ආකාරයටම ක්‍රියා කරයි.

2020.12.31 දිනට සහභාගීත්ව නොබැඳි ගිණුමේ (10875091) ශේෂය වූ එම්.වී.ආර් 4,649,500.02,

**නිර්දේශය**

**------------**

අනෙකුත් වගකීම් ගිණුම්වල දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කෙරේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | මය සාක්ෂි ලබා දී නොතිබුණි. | 2020.12.31 දිනට ශිෂ්‍ය ණයවල මුළු හිඟ ශේෂය සමඟ සමාන වේ. (මාලදිවයින් ශිෂ්‍ය ණය -22310542 හි ගෙවිය යුතු මුදල.) | |
| (ii) | අයි.සී.බී.එස් සහ ප්‍රයිම් පද්ධතියේ ඉලෙක්ට්‍රෝන ගිණුම් ශේෂය සංසන්දනය කිරීමේදී රු. 1,186,978,749 ක් වටිනා නොගැලපෙන ගනුදෙනු නිරීක්ෂණය විය. දීර්ඝ කාලයක සිට කිසිදු නිරවුල් කිරීමකින් තොරව පවතින ශේෂ වලින් මෙම නොගැලපෙන ගණුදෙණු සමන්විත වන බව නිරීක්ෂණය විය. විස්තර පහත දක්වා ඇත.<br><br>වර්ෂය — මුදල (රු.)<br>2016 — 143,859,408<br>2017 — 20,647,869<br>2018 — 8,661,890<br>2019 — 7,021,874<br>2020 — 1,006,787,708<br>**එකතුව — 1,186,978,749** | පහත හේතූන් නිසා ගිණුමේ ශේෂයක් පවතී.<br>වෙනත් බැංකු විසින් තවමත් හිමිකම් නොපෑ අරමුදල්.<br>අදාළ පාර්ශ්වවලින් ණය උපදෙස් ලැබෙන තෙක් අරමුදල් රඳවා තබා ගනී.<br>2020 දී ඩෙබිට් ඊ-කොම් ගනුදෙනුව හඳුන්වාදීමත් සමඟ ගනුදෙනු අගයන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. එය නොගැලපෙන ගණුදෙණුවලටද බලපායි.<br>වෙනත් බැංකුවකින් හෝ අදාළ පාර්ශ්වයන්ගෙන් උපදෙස්/හිමිකම් ලැබෙන තුරු අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ක්‍රෙඩිට් සහ ඩෙබිට් කාඩ් ගනුදෙනුවලට අදාළ දිගුකාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ. |

**1.6.2 අත්තිකාරම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2020 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රීය ගණුදෙනුකරුවන් 20 දෙනාගේ මුළු හිඟ මුදල රු. මිලියන 24,828.35 ක් වූ අතර එය එම දිනට බැංකුවේ මුළු අක්‍රීය දළ ණය හා අත්තිකාරම්වලින් සියයට 25 ක් නියෝජනය කරයි. විස්තර පහත දැක්වේ.<br><br>අංකය — ගණුදෙනුකරුගේ නම — මුළු හිඟ මුදල (රු. මිලියන)<br>1 — ජයවික්‍රම සහල් (පුද්) සමාගම — 2,903.99<br>2 — කේ. ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින් (පුද්) සමාගම — 2,697.93 | ජයවික්‍රම සහල්, කේ. ඩී. ඊබට්, රුහුනු සංවර්ධන, ආර්.එන් කන්ස්ට්‍රක්ෂන්ස් , ආර්.ඩී.එම්.ඩී ටෙක්ස්ටයිල්, සෙනාරෝ මෝටර් සමාගම සහ ඉසුරු ඉන්ජිනියරින් සඳ හා ඇගයීම් ක්‍රියාවලිය යටතේ පවතින පුනර්ජීවන පැකේජය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය | ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීමට බැංකුව විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ. |

| | | |
|---|---|---|
| 3 | සින්ටෙසී (පුද්) සමාගම | 2,001.26 |
| 4 | සීමාසහිත ඩබ්ලිව්.එම් මෙන්ඩිස් සහ සමාගම | 1,485.19 |
| 5 | රුහුනු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් | 1,296.77 |
| 6 | එන්.බී ෆුඩ්ස් (පුද්) සමාගම | 1,253.47 |
| 7 | අනුදාන් හෝල්ඩින් (පුද්) සමාගම | 1,248.27 |
| 8 | ලින්ක් ඉන්ජිනියරින් (පුද්) සමාගම | 1,223.11 |
| 9 | කඩුවෙල හෝල්ඩිංග්ස් | 1,105.90 |
| 10 | ආර්.එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) ස මාගම | 1,041.59 |
| 11 | ආර්.ඩී.එම්.ඩී ටෙක්ස්ටයිල් (පුද්) සමාග ම | 1,033.79 |
| 12 | ධූරස් රිට්‍රීට් (පුද්) සමාගම | 961.96 |
| 13 | ඩෝලියාඩු ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම | 932.041 |
| 14 | කාස්ට්වේ මාලදිවයින් (පුද්) සමාගම | 917.86 |
| 15 | නවලෝක වානේ කර්මාන්ත (පුද්) සමාගම | 890.73 |
| 16 | සී.එම්.එල්-එම්.ටී.ඩී කන්ස්ට්‍රක්ෂන්ස් සමාගම | 864.48 |
| 17 | සෙනාරෝ මෝටර් සමාගම | 803.54 |
| 18 | ශාන්බේ ජීන්ස් කොපොරේෂන් (පුද්) සමාගම | 760.22 |
| 19 | එන් ඇන්ඩ් ඒ ඉන්ජිනියරින් සර්විසස් (පුද්) සමාගම | 717.85 |
| 20 | ඉසුරු ඉන්ජිනියරින් (පුද්) සමාගම | 688.4 |
| **එකතුව** | | **24,828.35** |

ක්‍රියාත්මක කර ඇත.

එබැවින්, ජයවික්‍රම සහල් සහ ආර්.ඩී.එම්.ඩී ටෙක්ස්ටයිල් සඳහා ලබා දී ඇති පහසුකම් 2021 වසර අවසානයේ කාර්ය සාධන අංශයට නැවත වර්ගීකරණය කළ හැකි බව බැංකුවේ අදහසයි.

2022 වසර අවසානයේ අනෙකුත් සමාගම් නැවත වර්ගීකරණය කිරීමට ද අපේක්ෂා කරයි.

සින්ටෙසී (පුද්) සමාගම

2021.12.31 දිනට හිඟ ශේෂය රු. මිලියන 1,190.08 කි.

2021 අංක 08 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ චක්‍රලේඛයට අනුව, 2022.03.31 දින දක්වා නීතිමය සහ අතුරු ක්‍රියාමාර්ග අත්හිටුවන ලදී.

සීමාසහිත ඩබ්ලිව්.එම් මෙන්ඩිස් සහ සමාගම

සුරාබදු දෙපාර්තමේන්තුව විසින් මිශ්‍ර කිරීමේ බලපත්‍රය සහ එතනෝල් නිෂ්පාදන බලපත්‍රය ලබා දී නොමැති වීම හේතුවෙන් යෝජිත මුදල් ප්‍රවාහය බැංකුව වෙත යොමු කර නොමැත. අදාළ බලපත්‍රය ලබාදෙන තුරු කිසිදු ගෙවීමක් අයකර නොගන්නා ලෙස සමාගම අධිකරණයෙන් ඉල්ලා ඇත.

එන්.බී ෆුඩ්ස් (පුද්) සමාගම

2021.12.31 දිනට හිඟ ශේෂය රු. මිලියන 1,253.47 කි. නීතිමය

කටයුතු සිදුවෙමින් පවතී.

<u>අනුදාන් හෝල්ඩින් (පුද්) සමාගම</u>

2021.12.31 දිනට හිඟ ශේෂය රු. මිලියන 1,223.54 කි.

මූලික අයකිරීමේ ක්‍රියාමාර්ග (Parate execution) අත්හිටුවන ලදී.

නැවත සකස් කිරීම දෙසට සාකච්ඡා සිදු කරමින් පවතින අතර ඒ අතර තුර රු. මිලියන 3.2 ක සහ රු. මිලියන 20 කාරක ප්‍රාග්ධන පහසුකම් "සෞභාග්‍ය කොවිඩ් 19" පහසුකම යටතේ ලබා දී ඇත. කාරක ප්‍රාග්ධන පහසුකම් ඒ අනුව සේවාකරණය කර ඇත.

<u>ලින්ක් ඉන්ජිනියරින් (පුද්) සමාගම</u>

2021.12.31 දිනට හිඟ ශේෂය රු.මි. 1,171.70 කි.

පවතින අක්‍රීය ණය කළඹ සඳහා ඉල්ලා ඇති ආපසු ගෙවීමේ සැලැස්ම තවමත් ඉදිරිපත් කර නැත.

කෙසේ වෙතත්, බැංකුව විසින් ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ව්‍යාපෘතිය සඳහා මුදල් සපයන අතර ඒ අනුව එම ව්‍යාපෘතියේ ලාභයෙන් රු. මිලියන 32 ක් තැන්පත් කිරීමට ඔවුන් එකඟ විය.

<u>කඩුවෙල හෝල්ඩිංග්ස්</u>

පහසුකම් (උකස් කිරීම/මධ්‍ය කාලීන කෙටි

කාලීන ණය/ණයවර ලිපි/බැංකු අයිරාව) සඳහා දැනටමත් නඩු පවරා ඇති අතර තීන්දු ලැබීමට නියමිතය.

<u>ධූරස් රිට්‍රීට් (පුද්) සමාගම</u>
ඉහත සඳහන් පහසුකම් දෙකට උකස් කර ඇති ආවී නෙවර් පැරඩයිස් නිකේතනයේ උකස් කර ඇති දේපලෙහි බදු අයිතිය විකිණීම සඳහා සිවිල් අධිකරණය විසින් අංක 4003/සී.වී-සී/2019 දරණ බලාත්මක කිරීමේ නඩුව යටතේ 01.02.21 දින විකුණුම් අයිතිය ලබා දී ඇති අතර මාස 6ක් ඇතුළත උසාවියට දැනුම් දිය යුතුය.
ඒ අනුව, අපි ඉහළම ලංසුකරුවා නිර්ණය කර ප්‍රකාශයට පත් කර ඇති අතර 2021.03.07 වන දින ඩොලර් මිලියන 8.5 ක ලංසුව ප්‍රදානය කර ඇත. ඔවුන් නියමිත දිනට ගෙවීමට අපොහොසත් වී ඇති බැවින්, අප විසින් 2021.04.07 වන දින ඇ.ඩොලර් මිලියන 7.176 කට දෙවන පාර්ශවය වූ හැරි ඇන්ඩ් කම්පැනි ඉන්ටර්නැෂනල් (පුද්) සමාගමට ප්‍රදානය කර ඇත. ගෙවීමේ අවසන් දිනය 2021.05.09 විය. දෙවන පාර්ශවය ද නියමිත දිනට ගෙවීමට අපොහොසත් වී ඇත. දෙවන ලංසුකරු, හැරි ඇන්ඩ් කම්පැනි ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම අමතර කාල

සීමාවක් සහ විකුණුම් ක්‍රියාවලිය නතර කරන ලෙස ඉල්ලා නඩුවක් ගොනු කර ඇත. 2021.10.25 දින තීන්දුව ලැබුණු අතර අමතර කාලසීමාවක් ලබා දීමට නීතිමය වලංගු භාවයක් නොමැත. මේ අතරතුර, නැවත විකිණීමේ අයිතිය ලබා ගැනීම සඳහා බලාත්මක කිරීමේ නඩුව ක්‍රියාත්මක කරන ලෙස බැංකුව අධිකරණයට ලිපියක් යවා ඇත. මීළඟ විභාග දිනය තවමත් දැනුම් දී නැත. උසාවියෙන් නැවතත් විකුණුම් අයිතිය බලාපොරොත්තු වේ.

<u>ධෝලියාධූ ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම</u>

ඉන්දියානු රාජ්‍ය බැංකුව (එස්.බී.අයි) දේපල විකිණීම සඳහා ප්‍රකාශයට පත් කර ඇති අතර ඔවුන් ආයෝජකයෙකු සමඟ සාකච්ඡා කරමින් සිටී. 2020.09.01 දින එස්.බී.අයි කාර්යාලයේ පැවති රැස්වීමේදී සාකච්ඡා කළ ඔවුන්ගේ අපේක්ෂාව අනුව, මාස හයක් ඇතුළත ක්‍රියාවලිය අවසන් වනු ඇත. 2020.11.02 වන දින, ජ්‍යෙෂ්ඨ ණය කළමනාකරු ඇතුළු කණ්ඩායමක් ඉන්දීය රාජ්‍ය බැංකුව, මාලදිවයින් බැංකුව, කේ.පී.එම්.ජී හි තක්සේරු නිලධාරි සහ තැරැව්කාර සමාගමේ නියෝජිතයින්

දෙදෙනෙකු සමඟ දේපල පරීක්ෂා කිරීමට ගොස් ඇත. මාලදිවයිනේ ලංකා බැංකු ශාඛාව මාලදිවයින් බැංකුවේදී (බී.එම්.එල්) තක්සේරුව අවසන් කිරීමට 2021 ජනවාරි මස රැස්වීමක් පැවැත්විය. අනෙත් බැංකු දෙකෙන් ප්‍රතිචාර බලාපොරොත්තුවෙන් සිටී. තවද, 2021 ජූලි 15 වන දින එස්.බී.අයි හි ණය කළමනාකරු සමඟ පැවති නවතම සංවාදයේදී, සමාගම 2012 සිට ව්‍යවස්ථාපිත හිඟ මුදල් ගෙවා නොමැති බැවින් ඔවුන් එවා අත්හරින ලෙස රජයෙන් ඉල්ලා සිටින බව දැනුම් දුන්නේය.

<u>කාස්ට්වේ මාලදිවයින් (පුද්) සමාගම</u>

2020 අගෝස්තු 30 දිනැති පිරිනැමීමේ ලිපියේ එකඟ වූ කොන්දේසි වලට අනුකූල වූ පසු සහ ලේඛන සම්පූර්ණ වූ පසු නැවත සකසන ලද පහසුකම් ලබා දෙනු ඇත. පිරිනැමීමේ ලිපියට අනුව සමාගම විසින් පිරිනැමීමේ ලිපියේ දින සිට දින 60ක් ඇතුළත ඇ.ඩොලර් 250,000 ක්ද, පිරිනැමීමේ ලිපියේ දින සිට දින 150ක් ඇතුළත ඇ.ඩොලර් 250,000 ක් සහ තවත් ඇ.ඩොලර් 100,000 ක් පිරිනැමීමේ ලිපියේ දිනයේ සිට දින

300 ක් ඇතුළතද තැන්පත් කළ යුතුය. ඉහත කොන්දේසියට අනුව, 1 වන ඇ.ඩොලර් 250,000 සහ 2 වන ඇ.ඩොලර් 250,000 එකඟ වූ නියමිත දිනට පෙර තැන්පත් කර ඇත. ඇ.ඩොලර් 100,000 ක අවසන් ගෙවීම පිරිනැමීමේ ලිපියට අනුව 2021.06.24 දින ගෙවනු ලැබේ. එය නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය යටතේ පවතී. එකඟ වූ පරිදි, සමාගම අරමුදල් තැන්පත් කර නොමැති අතර, එබැවින්, අයකර ගැනීමේ දිනයක් තහවුරු කිරීමට නොහැකි විය.

<u>නවලෝක වානේ කර්මාන්ත (පුද්) සමාගම</u>

සම්පූර්ණ අක්‍රීය ණය පැකේජය 26.07.2021 දින නැවත සකස් කර ඇත. නැවත සකස් කිරීමේ කොටසක් දේපළකට එරෙහිවත් ඉතිරි කොටස අධ්‍යක්ෂවරුන්ගේ ඇපවලට එරෙහිවත් සුරක්ෂිත කර ඇත. 2022 අගෝස්තු මාසයේදී මාස 13 ක් අඛණ්ඩව ආපසු ගෙවීම් කළ පසුව ක්‍රියාකාරී අංශයට ණය පරිවර්තනය කිරීමට හැකි වේ. ව්‍යාපාර පුනර්ජීවනය සඳහා සමාගමට රු. මිලියන 500.0 ක නව ආනයන පහසුකමක් ද ලබා දී ඇත.

<u>ශාන්බෙ ජීන්ස් කොපොරේෂන්</u>

(පුද්) සමාගම
2020.12.31 දිනට හිඟ රු. මිලියන 756.11 කි.
උකස් කළ දේපළ දෙක වෙන්දේසි කර 2018.12.08 දින බැංකුවට පවරා ඇත.
ඇවරකිරීමේ නඩුව සිදුවෙමින් පවතී.

<u>එන් ඇන්ඩ් ඒ ඉන්ජිනියරින් සර්විසස් (පුද්) සමාගම</u>
සමාගමේ මුදල් ප්‍රවාහය සැලකිල්ලට ගනිමින් ඕ.අයි.සී 340/2020 ට අනුව එකතුව රු. මිලියන 632.0 ක නැවත සකස් කරන ලද කාලීන ණය තුනේ හිඟ ශේෂයන් නැවත සකස් කරන ලදී. එකතුව රු. මිලියන 1,077.19 ක දැනට පවතින නැවත සකස් කරන ලද කාලීන ණය අක්‍රමවත් ලෙස සේවාකරණය කරන අතර, පසුගිය මාස 06 තුළ එම ණය අයකර ගැනීම සඳහා සමාගම විසින් රු. මිලියන 35.8 ක් වෙන් කර ඇත.

(ii) 2020 වර්ෂය තුළදී ණය ප්‍රදානය කරන ලද ගනුදෙනුකරුවන්ගේ ලැයිස්තුවක් පවතින අතර එම ණය අක්‍රීය ණයවලට එම වසරේදීම මාරු කරන ලදි (නැවත සකස් කළ පහසුකම් හැර). පහත සඳහන් ගනුදෙනුකරුවන් ඉහත ලැයිස්තුවේ ප්‍රධාන ගනුදෙනුකරුවන් 20 නියෝජනය කරයි.

| අංකය | ගනුදෙනුකරුගේ නම | ණය සංඛ්‍යාව | ගෙවන ලද මුළු මුදල | **2020.12.31** දිනට හිඟ මුදල |
|---|---|---|---|---|
| -- | ----------- | --------- | ------------- | ----------- |
| | | | **(රු. මිලියන)** | **(රු.මිලියන)** |
| 1 | කේ.ඩී ර්බට ඇන්ඩ් සන්ස් | 12 | 241.45 | 185.27 |

**<u>කේ ඩී ර්බට් සහ රුහුණු සංවර්ධන</u>**
මේවා ඉදිකිරීම් සමාගම් වන අතර කර්මාන්තයේ පහත වැටීමේ ප්‍රවණතාවය ලබා ගත් පහසුකම් ආපසු ගෙවීමට බලපා ඇත. ආර්.ඩී.ඒ සහ අනෙකුත් ආයතන වලින් ගෙවීම් විශේෂයෙන් ප්‍රමාද වී ඇත.

කිසියම් ගනුදෙනුකරුවෙකුට ණය ලබා දීමට පෙර බැංකුව විසින් සතුටුදායක පාරිභෝගික ඇගයීම් සිදු කර ඇති බව සහතික කිරීමට නිර්දේශ කෙරේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| | හෝල්ඩිං (පුද්) සමාගම | | | | සේනාරෝ මොටර් කම්පැනි (පුද්) සමාගම |
| 2 | සේනාරෝ මොටර් කම්පැනි (පුද්) සමාගම | 11 | 64.58 | 64.58 | රටේ වාහන මිල ඉහළ යාම හේතුවෙන් වාහන ව්‍යාපාරයේ පසුබෑමේ ප්‍රවණතාවයකට සමාගම මුහුණ දී ඇත. |
| 3 | රුහුනු සංවර්ධන කොන්ත්‍රාත්කරුවන් සහ ඉංජිනේරු (පුද්) සමාගම | 8 | 95.00 | 32.50 | නවලෝකා වානේ කර්මාන්ත (පුද්) සමාගම<br>මහ බැංකුවේ මාර්ගෝපදේශයන්, 70.30 රීතියට අනුව රු. |
| 4 | නවලෝකා වානේ කර්මාන්ත (පුද්) සමාගම | 3 | 30.00 | 30.00 | මිලියන 30.0 ක මුදල් වෙළෙඳපොළ ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය |
| 5 | ට්‍රෙන්ඩ් සෙටර්ස් (පුද්) සමාගම | 1 | 25.00 | 25.00 | කර ඇත. කෙසේ වෙතත්, මෙම ණය මුදල 2021.07.26 දින නැවත |
| 6 | බෙලා ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | 1 | 18.52 | 18.52 | සකස් කර ඇත.<br>ට්‍රෙන්ඩ් සෙටර්ස් (පුද්) සමාගම<br>මෙම පහසුකම |
| 7 | ඩී.එම්.පී වූලරත්න මහතා | 3 | 15.40 | 15.40 | 2021.03.04 දින අක්‍රීය ණයවලින් ඉවත් කර ඇති අතර එය දැන් සාමාන්‍ය අංශයේ ඇත. |
| 8 | ඩබ්ලිව්.එම්.ඒ අබේරත්න මහතා | 1 | 15.00 | 14.97 | බෙලා ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම<br>සමාගම අපේක්ෂා කළ |
| 9 | එස්.වී.කේ ආනයන | 2 | 13.85 | 12.19 | පරිදි ව්‍යාපෘතිවලින් හිඟ මුදල් ලැබී නැත. නීතිමය |
| 10 | සිරිමාදුර හෝටල් සමාගම | 1 | 12.00 | 12.00 | ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට නියමිතව ඇත. |
| 11 | මෝක්ෂා සමාගම | 1 | 11.96 | 11.96 | ඩී.එම්.පී වූලරත්න මහතා<br>කොවිඩ් 19 වසංගත |
| 12 | කිඩ්ඩීස් සහ ටොයිස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම | 2 | 10.50 | 10.50 | තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර පහත වැටී ඇත. කෙසේ වෙතත් 2021 අප්‍රේල් මාසයේදී මෙම පහසුකම සම්පූර්ණයෙන් පියවා |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | එස්.එස්.ජේ.පී ප්‍රනාන්දු මහතා | 4 | 9.10 | 8.87 | ඇත. |
| 14 | කේ.යූ සුමනසේන මහතා | 2 | 8.68 | 8.68 | ඩබ්ලිව්.එම්.ඒ අබේරත්න මහතා<br>සහල් මෝලක් සඳහා ලබා දී ඇත. සහල් මෝල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ණය වාරික ගෙවීමට ගණුදෙනුකරුට හැකියාවක් නැත. නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. |
| 15 | හෙරතන් හොස්පිටලිටි (පුද්) සමාගම | 2 | 6.64 | 6.64 | |
| 16 | කලපුව නේචර් රිසෝට් | 5 | 6.23 | 6.23 | |
| 17 | කේ.ඒ.එස් සෝමපාල මහතා | 1 | 5.90 | 5.90 | |
| 18 | ඩබ්ලිව්.ජී.පී.එන් එල් වීරසූරිය මහතා | 1 | 5.55 | 5.55 | එස්.වී.කේ ආනයන<br>ණය ගැනුම්කරුට ඔහුගේ ව්‍යාපාරයේ යම් පාඩු සිදුවී ඇති නිසා එස්.වී.කේ ආනයන හි හිමිකරුට භාරකාර කුවිතාන්සි (ටී.ආර්) පහසුකම් තනි ගෙවීමකින් පියවීමට හැකියාවක් නොමැත.<br>එබැවින්, ණය ගැනුම්කරුට ඔහුගේ ව්‍යාපාරය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වසර දෙකක් සඳහා (2022 සැප්තැම්බර් දක්වා) රු. මිලියන 15.0 ක කාරක ප්‍රාග්ධන ණයක් ලබා දී ඇති අතර, එම ණය ගෙවීම සඳහා ඔහු මාසිකව රු. 650,000.00 කට ආසන්න මුදලක් ගෙවයි. ඊට අමතරව අක්‍රීය ණය ටී.ආර් පහසුකම් අයකර ගැනීම සඳහා මාසික ගෙවීමක් ලෙස තවත් රු. 50,000.00 ක් තැන්පත් කිරීමට ණය ගැනුම්කරු එකඟ වී ඇති අතර අපි 2021 ඔක්තෝබර් දක්වා රු.150,000 ක් (රු.50,000*3) අය |
| 19 | නිදහස් උළු කම්හල | 4 | 5.29 | 5.26 | |

කරගෙන ඇත. ඉහත කාරක ප්‍රාග්ධන ණය මුදල පියවීමෙන් අනතුරුව අක්‍රිය ණය ටී.ආර් පහසුකම් සම්පූර්ණයෙන් පියවන තෙක් රු.650,000.00 ක මාසික ගෙවීම දිගටම කරගෙන යාමට ණය ගැනුම්කරු එකඟ විය.

<u>සිරිමාදුර හෝටල් සමාගම</u>
හෝටල් අංශය යටතේ සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණයකි. එම ණය ඊළඟ දිනයේ විධිමත් කර ඇත.

<u>මෝක්ෂා සමාගම</u>
හිඟ මුදල මාස දෙකක කාලයක් තුළ පියවීමට සමාගම එකඟ විය.

<u>කිඩ්ඩීස් සහ ටොයිස් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම</u>
අදහස් දැක්වීමක් නොමැත.

<u>එස්.එස්.ජේ.පී පුනාන්දු මහතා</u>
කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ධීවර කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ල වී ඇති අතර ගණුදෙනුකරු බහුදින බෝට්ටු දෙකක් අලුත්වැඩියා කිරීමට ආදායම වැය කර ඇත. 2021 වසර අවසන් වීමට පෙර හිඟ මුදල් පියවීමට ගණුදෙනුකරු එකඟ විය.

කේ.යූ සුමනසේන මහතා

සුරැකුමක් ලෙස තබා ඇති ස්ථාවර තැන්පතුව අවලංගු කිරීමෙන් පහසුකම පියවනු ඇත.

හෙරතන් හොස්පිටලිටි (පුද්) සමාගම

හෝටලයක් ඉදිකිරීම සඳහා පහසුකම් ලබා දී ඇත. කෙසේ වෙතත්, ඉදිකිරීම් තවමත් අවසන් කර නොමැත. එබැවින් ණය ගෙවීමට ගණුදෙනුකරුට ආදායමක් නොලැබේ.

කලපුව නේචර් රිසෝට්

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් සහ කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ උත්සව ශාලාවක ව්‍යාපාර කටයුතුවල ගණුදෙනුකරු නියැලී සිටී.
ඒ නිසා ආදායම පහත වැටී ඇත.
පහසුකම් නැවත සකස් කර ගැනීම සඳහා ගණුදෙනුකරු සමඟ සාකච්ඡා කළ නමුත් රට තුළ පවතින වසංගත තත්ත්වයත් සමඟ ආදායම පුරෝකථනය කිරීමට නොහැකි වීම හේතුවෙන් පහසුකම් නැවත සකස් කර නොමැත.

කේ.ඒ.එස් සෝමපාල මහතා

වී කෙටීමේ කාර්යය සඳහා පහසුකම ලබා දී ඇත. මිල උච්චාවචනයන්

| | | | |
|---|---|---|---|
| | | සහ දේශගුණික විපර්යාස හේතුවෙන් අස්වැන්න අඩු වී ඇත. ඒ නිසා මෝල නිසි පරිදි ක්‍රියාත්මක නොවේ.<br><br><u>ඩබ්ලිව්.ජී.පී.එන්.එල් වීරසූරිය මහතා</u><br>වී කෙටීමේ කාර්යය සඳහා පහසුකම ලබා දී ඇත. මිල උච්චාවචනයන් සහ දේශගුණික විපර්යාස හේතුවෙන් අස්වැන්න අඩු වී ඇත. ඒ නිසා මෝල නිසි පරිදි ක්‍රියාත්මක නොවේ.<br><u>නිදහස් උළු කම්හල</u><br>දෙවන වරට ප්‍රදානය කරන ලද මෙම ණය හතර, ඕ.අයි.සී 328/2019 සහන පැකේජය යටතේ පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් හානියට පත් සංචාරක කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා ලබා දුන් ණය වේ. ගණුදෙනුකරු සංචාරක හෝටල් සඳහා ටයිල් සපයන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි සමාගමකි. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, ගණුදෙනුකරුට අපේක්ෂා කළ පරිදි මෙම ණය ගෙවීමට නොහැකි විය. | |
| (iii) | ප්‍රාග්ධන කොටස සහ පොලිය ආපසු ගෙවීමක් නොමැති වුවද පාඩු ලබන රජය සතු ව්‍යවසායන් කිහිපයකට ලබා දුන් ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කිරීමෙන් බැංකුව වැළකි සිටී. එබැවින් අදියර 3 යටතේ හෙළිදරව් කරන ලද ණය අඩුවෙන් දැක්විය හැක. | <u>ශ්‍රී ලංකන් ගුවන් සමාගම (එස්.එල්.ඒ.එල්)</u><br>හානිකරණ ප්‍රතිපාදන සඳහා එස්.එල්.ඒ.එල් අදියර 2 යටතේ වර්ගීකරණය කර ඇති අතර 2021.09.30 දින රු. මිලියන 672.9 ක ප්‍රතිපාදන සලසා ඇත. ( | එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුව අදාළ අදියරවලට වර්ගීකරණය කිරීමේදී ගනුදෙනුකරුවන්ගේ සැලකිය යුතු මට්ටමේ ණය අවදානම සලකා බැලීමට නිර්දේශ කෙරේ. |

| රජය සතු ව්‍යවසායේ නම | ණය අංකය | ප්‍රතිව්‍යුහගත කළ වාර ගණන | සුරැකුම | සටහන | |
|---|---|---|---|---|---|
| ----- | ----- | ----- | -------- | -------- | |
| ශ්‍රී ලංකන් ගුවන් සේවය | 76913761<br>78038701<br>78038873<br>85759786<br>79233764<br>79930506<br>80825777 | වාර 10<br>වාර 8<br>වාර 8<br>වාර 1<br>වාර 8<br>වාර 10<br>වාර 7 | සහන ලිපිය<br>සහන ලිපිය<br>සහන ලිපිය<br>භාණ්ඩාගාර ඇපකරය<br>සහන ලිපිය<br>සහන ලිපිය<br>සහන ලිපිය | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුවර්තනය කිරීම පිළිබඳ සී.බී.එස්.එල් මාර්ගෝප දේශයට අනුව, සියලුම පහසුකම් පාහේ දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති බැවින් මෙම ණය පහසුකම් අදියර 3 යටතේ වර්ග කළ යුතුය. | රුපියල් නිරාවරණය සඳහා රු. මිලියන 213.5 ක් සහ ඇ. ඩොලර් නිරාවරණය සඳහා රු. මිලියන 459.4 ක්) එස්.එල්.ඒ.එල් වෙත ලබා දී ඇති පහසුකම් රජයේ භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද වලංගු සහන ලිපියක් මගින් ආවරණය කෙරේ. ශේෂ පත්‍රය වැඩිදියුණු කර ප්‍රති-ව්‍යුහගත කිරීම අවසන් වන තෙක් භාණ්ඩාගාරය විසින් තත්ත්වය නිරීක්ෂණය කරමින් සහ සහන ලිපිය අලුත් කරයි.<br>එස්.එල්.ඒ.එල් වෙත ඇ.ඩොලර් මිලියන 500 ක් රජය විසින් අනුමත කරන ලද අතර එයින් සී.පී.සී වෙත ඇ.ඩොලර් මිලියන 25.0 ක් ගෙවීමට සහ මෙහෙයුම් වියදම් පියවීම සඳහා 2020 වර්ෂයේදී ඇ.ඩොලර් මිලියන 150.0 ක් නිකුත් කරන ලදී. |
| මාර්ග සංවර්ධන අධිකාරිය | 73039168<br>73044929<br>73378065<br>73 36442<br>74018817<br>74086164<br>74129360<br>75098630<br>75119195<br>75801 | වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2<br>වාර 2 | භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගාර ඇපකරය<br>භාණ්ඩාගා | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුවර්තනය කිරීම පිළිබඳ සී.බී.එස්.එල් මාර්ගෝප දේශයට අනුව, සියලුම පහසුකම් පාහේ දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති බැවින් මෙම | කොවිඩ්-19 හේතුවෙන් ගුවන් තොටුපළ වසා දැමීම, එහි මුදල් ප්‍රවාහයට දැඩි ලෙස බලපා ඇත. ගුවන් තොටුපළ විවෘත කළද තවමත් මගීන් සිටින්නේ සීමිත තත්ත්වයකය.<br>මෙම පහසුකම්වලට අදාළ පොලී සංරචකය 2021 මැයි දක්වා නියමිත වේලාවට සපයයි. 2021 අංක 05 දරන සී.බී.එස්.එල් චක්‍රලේඛයට අනුව එස්.එල්.ඒ.එල් විසින් දැනටමත් එහි ඇ.ඩොලර් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | 082 | | ර ඇපකරය | ණය පහසුකම් 2 අදියර යටතේ වර්ග කළ යුතුය. | සහ රුපියල් කාලීන ණය සහ අයිරා පහසුකම් සඳහා පොලී සහන කාලයක් ඉල්ලා ඇත.<br>ඒ අනුව 2021 අගෝස්තු 30 දක්වා පොලී සහන කාලයක් ලබා දී ඇත. පොලී ගෙවීම 2021 සැප්තැම්බර් 1 වන දින සිට ආරම්භ වූ අතර කිසිදු හිඟයකින් තොරව ගෙවා ඇත.<br>තවද, රජයේ ඇපකර ණය පැහැර හැරීම සහ කපා හැරීම පිළිබඳ අත්දැකීම් අපට නොමැත. එම පදනම මත මෙම පහසුකම් අදියර 2 යටතේ සලකා බලා ඇත.<br><u>මාර්ග සංවර්ධන අධිකාරිය</u><br>ආර්.ඩී.ඒ හි ඉල්ලීම අනුව ණය ආපසු ගෙවීමේ කාලය වසර 15 දක්වා දීර්ඝ කිරීම සහ ප්‍රාග්ධන කොටස ගෙවීම් බුලට් ගෙවීමක් ලෙස කල් දැමීම මගින් ආපසු ගෙවීමේ ව්‍යුහය වෙනස් කිරීම මගින් ආර්.ඩී.ඒ ණය ප්‍රතිව්‍යුහගත කරන ලදී.<br>පහසුකම් අනුව ණය එක් වරක් පමණක් ප්‍රතිව්‍යුහගත කර ඇත. කෙසේ වෙතත් ආයතන අනුව ආර්.ඩී.ඒ ණය වාර දෙකක් සඳහා සීමා කර ඇත. |
| | 76079 442 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 76215 038 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 76663 267 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 76874 198 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 83009 099 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 84157 620 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 82975 661 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 75494 462 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 83584 764 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 85138 455 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 85918 910 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| | 85991 542 | වාර 2 | භාණ්ඩාගාර ඇපකරය | | |
| සීමාසහිත ලංකා සතොස | ටී.එල්-එල්488 961 | වාර 1 | භාරගැනීමේ ලිපිය | 2019.12.31 දක්වා ප්‍රාග්ධනය කොටස සහ උපචිත පොලීය අයකර ගැනීමටත් කාලීන ණය පහසුම්කම් 2 ක ලබා දීම අවසන් වන තෙක් තවදුරටත් උපචිත පොලීය අත්හැරීමටත් රු.8,626,982,993.38 ක සහ රු.1,612,745,537 ක කාලීන ණය | <u>සීමාසහිත ලංකා සතොස</u><br>2021.01.25 දින මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාරගැනීමේ ලිපියට |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙකක් ලබා දී ඇත. එබැවින් සීමාසහිත ලංකා සතොස අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කිරීමෙන් බැංකුව වැළකී සිටින බව පෙනියයි. | එරෙහිව අදාළ ආනයන ණය යටතේ සම්පූර්ණ වගකීම් ගෙවීම සඳහා රු.8,626,982,993.38 සහ රු.1,612,745,537.00 කාලීන ණය දෙකක් ලබා දී ඇත.<br>බැංකුව විසින් 2021 සැප්තැම්බර් 30 දක්වා ණය දෙකම යටතේ රු.3, 829,027,254.20 ක ණය වාරික ආපසු අයකර ගෙන ඇත. |
| ශ්‍රී ලංකා රජය | වාර 4 | ණය ගිවිසුම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුවර්තනය කිරීම පිළිබඳ සී.බී.එස්.එල් මාර්ගෝප දේශයට අනුව, සියලුම පහසුකම් පාහේ දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති බැවින් මෙම ණය පහසුකම් 3 අදියර යටතේ වර්ග කළ යුතුය. නමුත් ශ්‍රී ලංකා රජයට ණය ලබා දී ඇති බැවින් සියලුම පහසුකම් 1 අදියර යටතේ වර්ගීකරණ | <u>ශ්‍රී ලංකා රජය</u><br>ශ්‍රී ලංකා රජය වෙත ලබා දී ඇති ඇ.ඩොලර් 497, 000/-, ඇ.ඩොලර් මිලියන 14.0, ඇ.ඩොලර් මිලියන 25.0, ඇ.ඩොලර් මිලියන 28.0 සහ ඇ.ඩොලර් මිලියන 17.251 පහසුකම් සම්පූර්ණයෙන් පියවා ඇත.<br>ඇ.ඩොලර් මිලියන 100.0 පහසුකම ඇ. ඩොලර් මිලියන 75.0 ක් දක්වා අඩු කර නැවත ලබා දී ඇත. 2020.12.30 වන විට ඇ. ඩොලර් මිලියන 570.0 ක සම්පූර්ණ පහසුකම් 2021.11.12 වන විට ඇ. ඩොලර් මිලියන 563.38 දක්වා අඩු වී ඇත.<br>ශ්‍රී ලංකා රජයේ විදේශ ව්‍යවහාර මුදල් ණය නිරාවරණයට සාපේක්ෂව සම්පූර්ණ හානිකරණය පහත පරිදි වේ.<br>රු. මිලියන 3,606.5 (2021.09.30 දින රටේ ශ්‍රේණිගත කිරීම පහත හෙළීමට පෙර). |

ය කර ඇත.

රු.මිලියන 4,080.0 (2021.09.30 දින රටේ ශ්‍රේණිගත කිරීම පහත හෙලීමෙන් පසුව).

(iv) රජය සතු ව්‍යවසායන් සඳහා ලබා දී ඇති ඇතැම් පහසුකම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරන ලද භාණ්ඩාගාර වන්දිපූරණය/භාණ්ඩාගාර ඇප/සහන ලිපි දීර්ඝ කිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය වී ඇත. විස්තර පහත දක්වා ඇත.

| **රජය සතු ව්‍යවසායේ නම** | **සුරැකුම් වර්ගය (භාණ්ඩාගාර ඇපකරය/වන්දිපූරණය/ සහන ලිපිය)** | **යොමු අංකය** | **පහසුකම් මුදල** | **සුරැකුම කල් ඉකුත් වූ දිනය** | **සුරැකුම අලුත් කිරීමේ දිනය** | **වලංගුභාවය අවසන් වන දිනය** |
|---|---|---|---|---|---|---|
| ----- | ------- | ------ | ----- | ----- | ----- | ------ |
| මිහින් ලංකා (පුද්) සමාගම | සහන ලිපිය | ටීඕ/ආර්ථ් වී/එල් සී/495/2 | රු. මිලියන 1,650 | 31.03.2019 | 18.16.2020 | 31.12.2020 |
| | | ටීඕ/ආර්ථ් වී/එල් සී /460/7 | ඇ. ඩොලර් මිලියන 2.5 | 31.12.2018 | 18.06.2020 | 31.12.2020 |
| | | ටීඕ/ආර්ථ් වී/එල් සී /482/5 | ඇ. ඩොලර් මිලියන 2.5 | 31.12.2018 | 22.06.2020 | 31.12.2020 |
| | | ටීඕ/ආර්ථ් වී/එල් සී /495/4 | රු. මිලියන 1,650 | 31.12.2020 | 02.05.2021 | 31.12.2021 |
| | | ටීඕ/ආර්ථ් වී/එල් සී /460/13 | ඇ. ඩොලර් මිලියන 2.5 | 31.12.2020 | 02.05.2021 | 31.12.2021 |

<u>මිහින් ලංකා (පුද්) සමාගම</u>
කල් ඉකුත්වන දිනට පෙර භාණ්ඩාගාර ඇපකර සඳහා බැංකුව හිමිකම් ඉදිරිපත් කර ඇත. ඉන්අනතුරුව, **2021.12.31** දින හෝ ඈවර කිරීම අවසන් වන දින යන දින දෙකෙන් කලින් යෙදෙන දිනය දක්වා තව දුරටත් දීර්ඝ කිරීම ලැබුණි. ඒ අනුව ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කර ඇත.

<u>ශ්‍රී ලංකන් ගුවන් සේවය</u>
පවතින පහසුකම් සහන ලිපිය/භාණ්ඩාගාර ඇපකරවලට එරෙහිව සුරක්ෂිත කර ඇති අතර වලංගු කාල සීමාව ආවරණය කරයි.

<u>ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව</u>
බැංකුව විසින් කරන ලද ඉල්ලීම් කිහිපයකට අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂවරයා විසින් 2019.12.31 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් පරිදි භාණ්ඩාගාර වන්දිපූරණයේ වටිනාකම ඇ. ඩොලර් මිලියන 200.0 දක්වා 2019.07.31 දින සිට වලංගු වන පරිදි නැවත ස්ථාපිත කිරීම

රජය සතු ව්‍යවසායන් සඳහා ලබා දී ඇති ඇතැම් පහසුකම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර වන්දිපූරණය/භාණ්ඩාගාර ඇපකර/සහන ලිපිවල කාල සීමාවන් දීර්ඝ කිරීමේදී අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /460/10 | ඇ. ඩොලර් මිලියන 2.5 | 31.12.2020 | 02.05.2021 | 31.12.2021 | සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරන ලෙස විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඉල්ලා ඇත. |
| ශ්‍රී ලංකන් ගුවන් සේවය | සැනසිල්ලේ ලිපිය | ටීඕ/ආර්ර්වී/එල්සී /494/6 | රු. බිලියන 5.0<br>රු. බිලියන 4.0<br>රු. බිලියන 3.9 | 30.06.2020 | 07.07.2020 | 30.06.2021 | ඒ අනුව, 2020.05.19 දිනැති යොමු අංක. ටීඕ/ආර්ර්වී /ටීජී /361/3 යටතේ භාණ්ඩාගාර වන්දිපූරණය, වලංගු කාලය 2019.07.30 සිට 2020.07.30 දක්වා දීර්ඝ කරමින් නිකුත් කර ඇත. |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /499/5 | ඇ. ඩොලර් මිලියන 25.0 | 21.02.2019 | 18.05.2020 | 21.02.2021 | |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /499/3 | ඇ. ඩොලර් මිලියන 25.0 | 21.02.2019 | 29.03.2019 | 21.02.2020 | ලංකා ධීවර සංස්ථාව<br>ටීජී ටීඕ/ආර්ර්වී /ටීජී /536 හි ආරම්භක කල් ඉකුත්වන දිනය 2020.10.08 වන අතර මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2020.10.23 දිනැති ලිපියට අනුව එය 2021.01.08 දක්වා දීර්ඝ කර ඇත. |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /460/17 | ඇ. ඩොලර් මිලියන 32.5 | 31.12.2020 | 18.02.2021 | 31.12.2021 | |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /400/11 | ඇ. ඩොලර් මිලියන 32.5 | 31.12.2019 | 28.02.2020 | 31.12.2020 | |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /460/9 | ඇ. ඩොලර් මිලියන 32.5 | 31.12.2018 | 04.04.2019 | 31.12.2019 | |
| | | ටීඕ/ආර්ර්වී/එල්සී /482/7 | ඇ. ඩොලර් මිලියන 42.5 | 07.10.2019 | 07.10.2019 | 07.10.2020 | |
| | | ටීඕ/ආර්ර්වී/එල් | ඇ. ඩොලර් මිලියන | 07.10.2020 | 19.11.2020 | 07.10.2021 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | සී /482/10 | 42.5 | | | |
| | | ටීඕ/ ආර්ර් වී/එල් සී /482/5 | ඇ. ඩොලර් මිලියන 42.5 | 07.10.2018 | 26.10.2018 | 07.10.2019 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | භාණ්ඩාගාර වන්දිපූරණය | ටීඕ/ ආර්ර් වී /ටීජී/361/3 | ඇ. ඩොලර් මිලියන 200 | 30.07.2019 | 19.05.2020 | 30.07.2020 |
| ලංකා ධීවර සංස්ථාව | භාණ්ඩාගාර ඇපකරය | ටීඕ/ ආර්ර් වී /ටීජී /536/2 | රු. මිලියන 100 | 09.10.2020 | 23.10.2020 | 08.01.2021 |

(v) 2008 අංක 03 බැංකු පනත් විධානයට අනුව, ණය ගැනුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව කෙරෙහි බලපාන තත්ත්වයන් හේතුවෙන් එකඟ වූ කාලසීමාවට අනුව සම්පූර්ණ අයකර ගැනීමේ හැකියාව සැක සහිත නම් බැංකුව විසින් ක්‍රියාකාරි ණය සහ අත්තිකාරම් අක්‍රීය ණය සහ අත්තිකාරම් ලෙස වර්ග කළ යුතුය. කෙසේ වෙතත්, ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් දැකිය හැකි වුවද, බැංකුව පහත පාරිභෝගිකයින් නිවැරදි කාණ්ඩයට වර්ග කර නොමැති බව නිරීක්ෂණය විය. විස්තර පහත වගුවේ දක්වා ඇත.

| **ගණුදෙනුකරුගේ නම** | **2020 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය** | **සටහන** |
|---|---|---|
| ------- | ------------ | ------------ |
| | **(රු. මිලියන)** | |
| මිහින් ලංකා | 2,763 | දෙවරකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇති අතර 3 වන අදියරට වර්ග කළ යුතුය. කෙසේ වෙතත් බැංකුව රජයේ එෆ්.සී.වයි නිරාවරණ කාණ්ඩය යටතේ 2 වන අදියරට වර්ග කර ඇත. |
| රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | 2,652 | සී.ඊ.සී අඛණ්ඩව මූල්‍ය දුෂ්කරතා කිහිපයකට මුහුණ දුන් අතර රු. |

<u>මිහින් ලංකා</u>

පොළිය ඇතුළුව සම්පූර්ණ වගකීම් ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකර මගින් ණය සුරක්ෂිත කර ඇති නිසා බැංකුව ගණුදෙනුකරුව වර්ගීකරණය කර නැත.

<u>රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව</u>

පොලිය ඇතුළුව සම්පූර්ණ වගකීම් ආවරණය වන පරිදි භාණ්ඩාගාර ඇපකර මගින් ණය සුරක්ෂිත කර ඇත.

කෙසේ වෙතත්, බැංකුව එස්.එල්.එෆ්.ආර්.එස් 9 ට අනුකූලව පහසුකම්වල පොලී කොටස හානිකරණය කර ඇත.

2008 අංක 03 දරන බැංකු පනතේ විධානය යටතේ ලබා දී ඇති උපදෙස් අනුව ගනුදෙනුකරුවන් නිවැරදි කාණ්ඩයට වර්ග කිරීමට නිර්දේශ කෙරේ.

| | | | |
|---|---|---|---|
| | (සී.ඊ.සී) | මිලියන 2,000 ක භාණ්ඩාගාර ඇපකරයට එරෙහිව රු. මිලියන 2,000 ක කාලීන ණය පහසුකම ලබා දීමෙන් පසු රු. මිලියන 566.9 ක කාලීන ණය පහසුකම, පී.ඕ.ඩී රු. මිලියන 150 ක් සහ ටී.ඕ.ඩී රු. මිලියන 50 ක් අවලංගු කර ඇත. සැලකිය යුතු මට්ටමකට ණය අවදානම වැඩි වී ඇති බව නිරීක්ෂණය වූ අතර එබැවින් අක්‍රීය කාණ්ඩයට වර්ගීකරණය කළ යුතුය. | |
| (vi) | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ගනුදෙනුකරුවන්ගෙන් ණය දීමේ අනුපාතය සහ සහනාධාර අනුපාතය අය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට අක්‍රීය ගනුදෙනුකරුවන් 2030 කගේ පොලී අනුපාතිකය පද්ධතිය තුළ වෙනස් කර නොතිබුණි. එසේම අක්‍රීය ගනුදෙනුකරුවන් 36 දෙනෙකුගේ පොලී අනුපාතය පද්ධතියේ මුලින් අය කළ අනුපාතයට වඩා අඩු කර තිබුණි. | ශාඛාවල දෛනික පදනමින් මෙම කාරණය සමීපව නිරීක්ෂණය කරන යාන්ත්‍රණය දැන් ක්‍රියාත්මක වේ. 2021.11.12 දිනට පොලී අනුපාතිකය වෙනස් කර නොමැති අක්‍රීය ණය ගිණුම් සංඛ්‍යාව 1,101 ක් වන අතර ඒ සියල්ල දැන් පිළිවෙළට ඇත. | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ගනුදෙනුකරුවන්ගෙන් මුලින් එකඟ වූ පරිදි ණය දීමේ අනුපාතය සහ සහනාධාර අනුපාතය අය කිරීමට නිර්දේශ කෙරේ. |

**1.7 නීති ,රීති ,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනත | පහත සඳහන් කාලසීමාවන් තුළ ලංකා බැංකු ආඥාපනතට අනුව අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගේ අවශ්‍යතාවයට බැංකුව අනුකූල වී නොතිබුණි.<br>• 2020 ජනවාර 01 - 2020 අප්‍රේල් 21<br>• 2020 දෙසැම්බර් 08 – 2020 දෙසැම්බර් 31 | බලාත්මක නීතියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ බැංකුව භාර අමාත්‍යවරයා විසින් බැවින් මෙය බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය කාරණයකි. වර්තමානය වන විට අධ්‍යක්ෂ මණ්ඩලය **6** | 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනතේ අවශ්‍යතායවන් ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙනෙකුගෙන් සමන්විත වේ. | |
| (ii) | 2007 අංක 11 දරන බැංකු පනත් විධානය, වගන්තිය 3 (2) (iv) | 2020 ජනවාරි 01 සිට 2020 ජනවාරි 13 දක්වා කාලය සඳහා බැංකුව අවම වශයෙන් ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගේ අවශ්‍යතාවයට අනුකූල වී නොතිබුණි. | බලාත්මක නීතියට අනුව අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ බැංකුව භාර අමාත්‍යවරයා විසින් බැවින් මෙය බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය කාරණයකි. දැනට මණ්ඩලය ස්වාධීන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් සමන්විත වේ. | 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (2) (iv) වගන්තියේ අවශ්‍යතායවන්ට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 හි ඡේදය (2) අනුව, දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අදාළ රෙගුලාසිවලට අනුව රජයට අයත් ව්‍යවසායන්වල සේවකයින් ඇතුළු රාජ්‍ය නිලධාරීන්ගේ උපයන විට ගෙවන බදු, බදු ගෙවිය යුතු සේවක ඉපැයීම්වලින් අඩු කළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ ලංකා බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කර ඇති සාමූහික ගිවිසුම මගින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. එය මත පදනම්ව, 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා සේවක ඉපැයීම්වලින් අඩු නොකර සේවකයින් වෙනුවෙන් උපයන විට ගෙවන බදු ලෙස බැංකුව රු. 22,324,700 ක් ගෙවා ඇත. | නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී 03/2016 යටතේ දක්වා ඇති උපදෙස්වලට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 17.8 ක ලාභයක් වූ අතර ඊට අනුරූප පෙර වර්ෂයේ ලාභය රු. බිලියන 23 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 5.2 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ ගාස්තු පෙර වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ රු. බිලියන 12.6 කින් හෙවත් සියයට 68 කින් ඉහළ යාම ප්‍රධාන හේතුව වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් විෂයයන් ඉකුත් වර්ෂය සමඟ සසඳා වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟින් පහත දක්වා ඇත.

| විස්තර | විචලා මුදල වැඩි වීම/ (අඩු වීම) | විචලනය | විචලාතාවයට හේතුව |
|---|---|---|---|
| | (රු .බිලියන) | % | |
| පොලී ආදායම | 5.8 | 3 | පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ දළ ණය සහ අත්තිකාරම් වැඩිවීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් පොලී ආදායම ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂය සඳහා දළ ණය සහ අත්තිකාරම් පෙර වසර හා සසඳන විට රු. බිලියන 466.4 කින් හෙවත් සියයට 28 කින් වැඩි වී ඇත. රු. බිලියන 466.4 ක සමස්ත දළ ණය වැඩිවීමෙන් රු. බිලියන 276.8 ක් සෘජුව රජයට සහ රාජ්‍ය ව්‍යවසාය සඳහා ණය ලබා දීම නියෝජනය කරන අතර ඉතිරි රු. බිලියන 189.6 වැඩි වීම පුද්ගලික අංශයට ණය ලබා දීම නියෝජනය කරයි. |
| පොලී වියදම | 6.2 | 4 | තැන්පතු පදනම වැඩි වීම සහ බැංකුවේ ණය ගැනීම් හේතුවෙන් පොලී වියදම වැඩි වී ඇත. බැංකුවේ තැන්පතු පදනම පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ රු. බිලියන 469.6 කින් හෙවත් සියයට 23 කින් ඉහළ ගොස් ඇත. පෙර වසර හා සසඳන විට සමාලෝචිත වර්ෂය තුළ ණය ගැනීම් රු. බිලියන 76.1 කින් හෙවත් සියයට 33 කින් ද වැඩි විය. ප්‍රතිමිළදිගැනීම් ණය ගැනීම් රු. බිලියන 22.9 කින්, ප්‍රතිමූල්‍ය ණය ගැනීම් රු. බිලියන 20 කින්, දේශීය මුදල් වෙළෙඳපොළ ණය ගැනීම් රු. බිලියන 15 කින්, විදේශ විනිමය ණය ගැනීම් රු. බිලියන 7.7 කින් සහ ඒ.ටී 1 ප්‍රාග්ධන උපකරණ මත නව ණය ගැනීම් රු. බිලියන 15 කින් ඉහළ යාමෙන් ණය ගැනීම් වැඩිවීම සමන්විත වේ. |
| ණය හා වෙනත් අලාභ සඳහා හානිකරණ ගාස්තු | 12.6 | 68 | අදියර II සහ III හි ණය නිරාවරණය වැඩි වීම, ඇ. ඩොලර්වලින් නියෝජන කරන ලද රජයේ සහ රජය සතු ව්‍යවසායන්ගේ නිරාවරණය මත සිදු කරන ලද අතිරේක හානිකරණ, සංචාරක ව්‍යාපාරය සහ ඉදිකිරීම් වැනි අවදානම් ඉහළ කර්මාන්ත සඳහා හානිකරණ ප්‍රතිපාදන වැඩි වීම සහ බැංකුවේ ණය කළඹ වැඩි වීම නිසා අදියර I හානිකරණ ප්‍රතිපාදන වැඩි වීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් හානිකරණ ගාස්තු වැඩි වී ඇත. |

| | | | |
|---|---|---|---|
| ආදායම් බදු | (0.8) | (12) | 2019 දෙසැම්බර් සහ 2020 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි පිළිවෙලින් එන්.බී.ටී සහ ඩී.ආර්.එල් අහෝසි කිරීම හේතුවෙන් ආදායම් බදු වියදම් අඩු වී ඇත. |

**2.3 අනුපාත විශ්ලේෂණය**

ලබා දී ඇති තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා බැංකුවේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| විස්තර | කර්මාන්තයේ අනුපාතය * | බැංකුව 2020 | 2019 |
|---|---|---|---|
| **කාර්ය සාධන අනුපාත** | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ (ආර්.ඕ.ඊ) | 10.9 | 11.9 | 16.8 |
| වත්කම් මත ප්‍රතිලාභ (ආර්.ඕ.එ) | 1.0 | 0.9 | 1.3 |
| පොලී ආන්තිකය | 3.1 | 2.8 | 3.3 |
| **වත්කම්වල ගුණාත්මක අනුපාතය** | | | |
| දළ අක්‍රීය අත්තිකාරම් ( එන්.පී.එල්) | 4.7 | 4.8 | 4.8 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාත** | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 9 %) | 13.1 | 11.2 | 11.2 |
| මුළු ප්‍රාග්ධනය (අවම 13 %) | 16.7 | 14.9 | 15.6 |
| **ව්‍යවස්ථාපිත අනුපාතය** | | | |
| ද්‍රවශීලතා වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාව 20%) | 33.8 | 26.6 | 24.6 |

* ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද වාර්ෂික තොරතුරු වලින් කර්මාන්තයේ අනුපාත උපුටා ගන්නා ලදි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය විසින් නිකුත් කරන ලද විමර්ශන වාර්තා මගින් පහත සඳහන් බැංකුවේ සිදුවූ ප්‍රධාන වංචා සහ අලාභ සිදුවීම් අනාවරණය විය. | | |
| (i) බිබිල ශාඛාවේ ශාඛා කළමනාකරු පුද්ගලික ආයතනයක සේවය කරන සේවකයන් 29 දෙනෙකුගේ නම් මත ණය ගිණුම් 29 ක් ඔවුන් නොදැනුවත්ව ආරම්භ කර ඇත. එම ණය ගිණුම් විවෘත කිරීම සඳහා ශාඛා | විමර්ශනය අවසන් කර ඇත. විභාගකිරීම් සිදුවෙමින් පවතී. සියලුම ණය ලේඛන පද්ධතියට උඩුගත කළ යුතු | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් |

| | | | |
|---|---|---|---|
| | කළමණාකරු විසින් ව්‍යාජ ලේඛන සකස් කර රු. මිලියන 14.5 ක මුදලක් එම පෞද්ගලික ආයතනයේ හිමිකරුට ලබාදී තිබුණි. එසේම ණය වාරික නොගෙවීම හේතුවෙන් එම ණය අක්‍රීය ණය ලෙස වර්ගීකරණය වීම වැලැක්වීමට කළමනාකරු සිය මුරපදය භාවිත කරමින් පද්ධතිය වෙනස් කර තිබුණි. | සහ අදාළ නියෝජිත අධිකාරියට අනුව පරිශීලක පැතිකඩ නිර්වචනය කර ඇති, ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇති බැවින් මෙවැනි සිදුවීම් සිදුවීමේ සම්භාවිතාව අවම වේ.<br>තවද, ඩී.එම්.එස් හි වැඩ ප්‍රවාහය ශාඛාවේ අභ්‍යන්තර පාලන නිලධාරියාගේ (අයි.සී.ඕ) ස්වාධීන සත්‍යාපනය මත පමණක් සම්පූර්ණ කළ හැක. තවද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අයි.එස් විගණන ඒකකය දිනපතා බකට් නිෂ්කාශනය (Bucket Clearance) කිරීමේ උත්සාහයන් නිරීක්ෂණය කරන අතර අදාළ වන පරිදි ශාඛා කළමනාකරු, ප්‍රදේශ කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී වෙත දෛනික පදනමින් වාර්තාවක් නිකුත් කරයි. | ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |
| (ii) | ලේක්වීව් ශාඛාවේ ණය නිලධාරිනිය ව්‍යාජ අත්සනක් සහ ව්‍යාජ හැඳුනුම්පත් අංකයක් යොදාගෙන ව්‍යාජ ණය ගිණුම් 14 ක් සහ ඇගේ මවගේ නමට ඉතුරුම් ගිණුමක් සාදා ඇත. ඇය ව්‍යාජ ණය ගිණුම් 14ක් සඳහා රු. 7,147,000 ක් ලබාදී එම මුදල් නිර්මාණය කළ ඉතිරිකිරීමේ ගිණුමට තැන්පත් කර ඇත. පසුව ඇය තම මවගේ නමට ව්‍යාජ මුදල් ලබා ගැනීමේ පත්‍රිකා සාදා ඉතිරි කිරීමේ ගිණුමේ තිබූ මුදල් ආපසු ලබාගෙන එම මුදල් පෞද්ගලික කටයුතු සඳහා යොදවා ඇත. | විමර්ශනය අවසන් කර ඇත. සියලුම ණය ලේඛන පද්ධතියට උඩුගත කළ යුතු සහ අදාළ නියෝජිත අධිකාරියට අනුව පරිශීලක පැතිකඩ නිර්වචනය කර ඇති, ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇති බැවින් මෙවැනි සිදුවීම් සිදුවීමේ සම්භාවිතාව අවම වේ. තවද, ඩී.එම්.එස් හි වැඩ ප්‍රවාහය ශාඛාවේ අභ්‍යන්තර පාලන | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මඟහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | | නිලධාරියාගේ (අයි.සී.ඕ) ස්වාධීන සත්‍යාපනය මත පමණක් සම්පූර්ණ කළ හැක. තවද අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අයි.එස් විගණන ඒකකය දිනපතා බකට් නිෂ්කාශනය (Bucket Clearance) කිරීමේ උත්සාහයන් නිරීක්ෂණය කරන අතර අදාළ වන පරිදි ශාඛා කළමනාකරු, ප්‍රදේශ කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී වෙත දෛනික පදනමින් වාර්තාවක් නිකුත් කරයි. | |
| (iii) | ආරක්ෂක අමාත්‍යාංශයේ සේවය කරන බව පැවසූ ණය ගැණුම්කරුවන් 5 දෙනෙකුට ඔහුන් ලබාදුන් ව්‍යාජ ලේඛන ලබාගෙන මරදාන ශාඛාවෙන් රු. 6,525,000 ක ණය ලබාදී ඇත. ශාඛා කාර්ය මණ්ඩලය ණය ගැණුම්කරුවන් විසින් සපයන ලද ලේඛනවල නිරවද්‍යතාවය තහවුරු කර හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ ඔවුන්ගේ රැකියාව තහවුරු කර නොතිබූ අතර එම නිසා මේ සම්බන්ධයෙන් නොසැලකිලිමත් ලෙස ක්‍රියා කර ඇත. | විමර්ශන සහ විභාගකිරීම් අවසන් කර ඇත.<br>ඕ.අයි.සී 319/2018 ට කරන ලද 08 වැනි සංශෝධන යටතේ ණය නිලධාරියා අදාළ සේවා යෝජකයා විසින් ලබා දෙන 375 පෝරමය නැවත තහවුරු කර ගත යුතු වන පරිදි සේවකයින්ට ලබා දෙන ණය පිළිබඳ අභ්‍යන්තර පාලනය බැංකුව විසින් ශක්තිමත් කර ඇත. | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |
| (iv) | නිකවැරටිය සහ වාරියපොළ ශාඛාවේ සේවයේ නියළි නිලධාරියෙකු එම ශාඛාවේ අනෙකුත් කාර්ය මණ්ඩලය නොමඟ යවමින් ව්‍යාජ ලේඛන මත ජංගම ගිණුම් 3ක් සහ ඉතිරි කිරීමේ ගිණුම් 2ක් ආරම්භ කර ඇත. ඔහු මුදල් අයකැමිගේ මුරපදය අවභාවිත කර ඉහත ගිණුම්වලට අවම තැන්පතු මුදල මාරු කර ඇති අතර ජංගම ගිණුම් සඳහා චෙක් පොත් 3ක් ද ලබාගෙන ඇත. තවද ඔහු බැංකුවේ කාර්ය මණ්ඩලයට ව්‍යාජ ලේඛන සපයා ණය ගිණුම් 2ක් සාදා ඇත. රු. මිලියන 15.5 ක් වටිනා බැංකුවේ වත්කම් මූල්‍ය අවදානමකට ලක් කිරීම සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය. | විමර්ශනය අවසන් කර ඇත. ලේඛන කළමනාකරණ පද්ධතිය (ඩී.එම්.එස්) ක්‍රියාත්මක කිරීමත් සමඟ ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය දැන් ස්වයංක්‍රීය කර ඇති බැවින් මෙවැනි සිදුවීම් සිදුවීමේ සම්භාවිතාව අවම වේ.<br>තවද, දිනක විවෘත කරන ලද සියලුම ගිණුම් පසු දින ඒ පන්තියේ නිලධාරියෙකු විසින් පරීක්ෂා කළ යුතුය. | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (v) | නුගේගොඩ ශාඛාව විසින් ටීයානා මල්ටී (පුද්) සමාගම වෙත රු. මිලියන 328.648 ක ණය මුදලක් ද ගජබා සිටි සෙන්ටර් වෙත රු. මිලියන 684 ක ණය මුදලක් ද ලබා දී ඇත. මෙම අවස්ථා දෙකේදීම එම ශාඛාවේ නිලධාරීන් තම රාජකාරිය නිසියාකාරව ඉටුකර නොතිබූ අතර ණය ලබාදීමේ සහ පසු අධීක්ෂණ ක්‍රියාවලියේ අක්‍රමිකතා රැසක් නිරීක්ෂණය විය. මෙම ණය පිළිවෙලින් 2018 මැයි 31 සහ 2020 ජනවාරි 20 යන දිනවලදී අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර ඇත. 2020 දෙසැම්බර් 31 දිනට ටීයානා මල්ටී (පුද්) සමාගමේ සහ ගජබා සිටි සෙන්ටර් හි මුළු හිඟ ශේෂය පිළිවෙලින් රු. මිලියන 476.446 ක් සහ රු. මිලියන 834.407 ක් විය. | විමර්ශනය සිදුවෙමින් පවතී. ඉහත සඳහන් කළ පාලනයන්ට අමතරව සෑම සුපිරි ශ්‍රේණියේ ශාඛාවකම අයි.සී.ඕ යොදවා ඇති අතර නිසි ලෙස පවරන ලද අධිකාරියක් ක්‍රියාත්මක වේ. | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |
| (vi) | තණමල්විල ශාඛාවේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු 2020 පෙබරවාරි 05 සිට මාර්තු 10 දක්වා කාලය තුළ අවස්ථා පහකදී රු. මිලියන 15.95 ක මුදලක් ශාඛාවේ මධ්‍යම කාර්යාලයේ අපගේ ගිණුමට වංචනික ලෙස හර කර එම මුදල් සමීප ඥාතීන්ගේ ඉතුරුම් ගිණුම් 05 කට බැර කර ඇත. සියලුම ගිණුම්වලින් බැර කළ මුදල් නිලධාරියා විසින් වරින් වර ලබාගෙන ඇත. තවද මෙම නිලධාරියා ව්‍යාජ ලේඛන ලබාදී ඥාතීන් තිදෙනෙකුගේ නම් මත එකතුව රු. ලක්ෂ 9 ක ණය මුදල් 3ක් ලබාගෙන ඇත. එම ණය සම්පූර්ණයෙන්ම ගෙවා නොමැති අතර දැනට අක්‍රීය ණය කාණ්ඩයේ පවතී. | විමර්ශනය අවසන් කර ඇත. සෑම ශාඛාවකම මාසය අවසානයේ පොදු ලේජර ගිණුම තුලනය කිරීම සඳහා හොඳින් ස්ථාපිත ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන අතර එය පළාතේ මෙහෙයුම් කළමනාකරු විසින් අධීක්ෂණය කරනු ලැබේ.<br>සටහන් කිරීමට පෙර සෑම අවස්ථාවකදීම ඒ සහ බී පන්තියේ නිලධාරීන් විසින් පොදු ලේජර හර වවුචරයට අත්සන් කළ යුතුය. | අනාගතයේදී මෙවැනි වංචනික ක්‍රියාකාරකම් මගහරවා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවරයන් ආරම්භ කිරීමට නිර්දේශ කෙරේ. |
| (vii) | 2019 සහ 2020 කාලය තුළ පාරිභෝගික ගිණුම් 4 කින් රු. මිලියන 283.1 ක සාවද්‍ය සී.ඊ.එෆ්.ටී ගනුදෙනු 22 ක් සිදුවී ඇත. මූලික බැංකු පද්ධතිය සමඟ සන්නිවේදනය කිරීමට ගනුදෙනු තොරතුරු මාරු කිරීම සඳහා භාවිතා කරන ලද ‘ඊ.එෆ්.ටී සේවය’ මෘදුකාංගයේ (අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද තොරතුරු තාක්ෂණ මෘදුකාංගය) ‘පද්ධති දෝෂයක්’ හේතුවෙන් වැරදි සී.ඊ.එෆ්.ටී ගනුදෙනු සිදු විය. ඉලෙක්ට්‍රොනික බැංකු අංශය මගින් දෛනිකව සිදුකරන ලද සැසඳීමේ ක්‍රියාවලියේදී මෙම වැරදි සී.ඊ.එෆ්.ටී ගනුදෙනු අනාවරණය වී නොතිබුණි.<br><br>නව පාර්කින් ගිණුම් ව්‍යුහයක් භාවිතා කරමින් වඩාත් නිවැරදි, පරිශීලක හිතකාමී සහ බහුකාර්ය සැසඳීමේ පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා 2018 සිට ඉලෙක්ට්‍රොනික බැංකු අංශයේ සහ තොරතුරු තාක්ෂණ | විමර්ශනය අවසන් කර ඇත. බැංකුව සී.ඊ.එෆ්.ටී සැසඳීමේ ඒකකයක් ස්ථාපිත කර ඇති අතර සැසඳීමේ ක්‍රියාවලිය දිනපතා සිදු කිරීමට හඳුන්වා දී ඇත. | අනාගතයේදී එවැනි වැරදි ගනුදෙනු වළක්වා ගැනීම සඳහා වඩාත් නිවැරදි, පරිශීලක හිතකාමී සැසඳීමේ පද්ධතියක් සකස් කිරීමට නිර්දේශ කෙරේ. |

අංශයේ නිලධාරීන් අතර සාකච්ඡා පැවතියද, 2020 මැයි මාසයේ සිදු වූ වැරදි ගනුදෙනු සිදු වන තුරුම තොරතුරු තාක්ෂණ අංශයට යෝජිත සංවර්ධනය සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඒ.එම්.එල් ක්ලැරි5 පද්ධතිය හරහා ඉහළ වටිනාකම් ඇති සාවද්‍ය ණය ගනුදෙනු සම්බන්ධයෙන් අනතුරු ඇඟවීම් ජනනය කර ඇතත්, එම ගනුදෙනු අසාමාන්‍ය හෝ සැක කටයුතු ලෙස හඳුනා ගැනීමට එම ශාඛාවල නිලධාරීන්ට නොහැකි විය. සෑම ගණුදෙනුකරුවකුගේ ගිණුමකටම වැරදි ලෙස බැර කරන ලද සියලුම මුදල් සම්පූර්ණයෙන් අයකරගෙන ඇති අතර අනාගතයේදී සිදුවිය හැකි සියලු අවස්ථා සලකාබලමින් මෘදුකාංගය වෙනස් කර සංවර්ධනය කර ඇත.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ලංකා බැංකු ආඥාපනතේ යෝජිත සංශෝධන ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීම සඳහා පහත සඳහන් දෑ ඇතුළත් කිරීම සඳහා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 18 දිනැති ඔවුන්ගේ ලිපිය මගින් උපදෙස් ලබා දී ඇත.<br>• බැංකුවේ වර්ධනයට සහ සංකීර්ණත්වයට පහසුකම් සැලසීමේ අදහසින් ආයතනික පාලනය පිළිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් විධානයට අනුව අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ලෙස වැඩි කිරීම.<br>• බැංකු අංශයේ විශේෂඥයින් සහ විවිධ ක්ෂේත්‍රවල විවිධ නිපුණතා සහිත ප්‍රවීණයන් ඇතුළත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, සහ<br>• අනුකමිටුවල ඵලදායි ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවක් මණ්ඩල අනුකමිටුවලට වෙන් කිරීම.<br>ලංකා බැංකු ආඥාපනතේ 6(1) වගන්තියට යෝජිත සංශෝධන මගින් අධ්‍යක්ෂවරුන් හය සිට අට දක්වා වැඩි කළද, බැංකු අංශයේ විශේෂඥයින් සහ විවිධ ක්ෂේත්‍රවල විවිධ නිපුණතා සහිත ප්‍රවීණයන් පත් කිරීමට ප්‍රතිපාදන නොමැති බව නිරීක්ෂණය විය.<br>ඒ වෙනුවට බැංකු පනතේ අවශ්‍යතා සඳහා සුදුසු සහ යෝග්‍ය යැයි හැඟිය හැකි සුදුසු කුසලතා සහ අත්දැකීම් සම්මිශ්‍රණයක් සහිත අධ්‍යක්ෂවරුන් අට දෙනෙකු සිටින | ශ්‍රී ලංකා මහ බැංකුවේ (සී.බී.එස්.එල්) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ, 2018.02.18 දිනැති ඔහුගේ ලිපිය මගින් ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයාට අංක 11/2007 දරන බැංකු පනත් විධානයට අනුකූලව යෝජිත සංශෝධනය ක්‍රියාත්මක කිරීම කඩිනම් කරන ලෙස උපදෙස් දී ඇත.<br>ඒ අනුව, රැස්වීම් කිහිපයකින් පසු බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ (බී.ඕ.ඩී) අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, එවකට ලංකා බැංකුවේ සභාපතිවරයා විසින් ලංකා බැංකු ආඥාපනතට යෝජිත සංශෝධන 2019.10.19 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම්වරයා වෙත සී.බී.එස්.එල් හි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත | ලංකා බැංකුවේ ආඥාපනතට කරන සංශෝධන සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල වීමට නිර්දේශ කෙරේ. |

ලෙස නියම කරයි. ලංකා බැංකු ආඥාපනතේ 6 (1) වගන්තියට යෝජිත සංශෝධන තවමත් සිදු කරමින් පවතී.

පිටපතක් සමඟින් යොමු කර ඇත.

ඉන් අනතුරුව, 2020.06.02 දින මුදල්, ආර්ථිකය සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (නීති) සමඟ පැවති සාකච්ඡාවකදී, අධ්‍යක්ෂ (නීති) විසින් බැංකුවේ වත්මන් බී.ඕ.ඩී යෝජිත සංශෝධන සඳහා එකඟ වන්නේද යන්න තහවුරු කරන ලෙස බැංකුවෙන් ඉල්ලා ඇත.

ඒ අනුව, නීති දෙපාර්තමේන්තුව විසින් 2020.06.10 දිනැති සංදේශයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, 2020.08.13 දින පැවති රැස්වීමේදී, මණ්ඩලය විසින් නව සංශෝධන යෝජනාවක් පහත සඳහන් කරුණු ඇතුළත්ව ඉදිරිපත් කරන ලෙස ඉල්ලා ඇත;

1) අංක. 11/2007 දරන බැංකු පනත් විධානය ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා සිටින සංශෝධනය පමණක් සහ

2) පවතින වගන්තියේ අර්ථයට ප්‍රමාණාත්මක වෙනස්කම් ඇති කරන වගන්ති සංශෝධනය නොකර ආඥාපනත පැරණි පනතක් බැවින් අවශ්‍ය

අනෙකුත්
සංශෝධන.

ඒ අනුව, නීති දෙපාර්තමේන්තුව විසින් යෝජිත සංශෝධන බැංකුවේ ආයතනික කළමනාකරණ කමිටුවට (සී.එම්.සී) සහ වත්මන් බී.ඕ.ඩී වෙත නැවත ඉදිරිපත් කර අතර 2020.10.21 දින සී.එම්.සී වෙතින් සහ 2020.11.05 දින බී.ඕ.ඩී වෙතින් අනුමැතිය ලබාගෙන ඇත.

ලංකා බැංකුවේ සභාපතිවරයා විසින් සංශෝධිත යෝජනාව 2020.12.09 දිනැති ලිපිය මගින් භාණ්ඩාගාර ලේකම් වෙත යලි ඉදිරිපත් කර ඇත.

ඉන් අනතුරුව, අංක. 11/2007 දරන සී.බී.එස්.එල් විධානයට අනුකුල වීම සඳහා වැඩි කිරීමට නියමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව ඇතුළත් බැංකුවේ සභාපති විසින් එවන ලද සංශෝධන සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීම් ඉල්ලා පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2021.03.02 දිනැති ලිපියක් ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයා වෙත එවා ඇත.

ඉන් අනතුරුව, වැඩි කිරීමට නියමිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව ඇතුළුව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු පැහැදිලි කිරීම් සම්බන්ධයෙන් නීති දෙපාර්තමේන්තුව බී.ඕ.ඩී හි අනුමැතිය ලබාගෙන ඇත.

ඒ අනුව අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව පහත පරිදි සංශෝධනය කර ඇත.

***"මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට නොඅඩු සහ 13 ට නොවැඩි විය යුතුය"***

ක්‍රියාකාරී සැලැස්මේ 2 වන පිටුවේ අවසාන ඡේදයට පිළිතුරු දෙමින්, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් ලෙස පත් කිරීම සඳහා පහත සඳහන් වෘත්තිකයන් ඇතුළත් කිරීමට බැංකුව යෝජනා කර ඇත.
***"අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙක්*** මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙකු විය යුතුය (මෙතැන් සිට "නිසි නිලතල අධ්‍යක්ෂ" ලෙස හැඳින්වේ) ***සහ තවත් අයෙක් සුදුසුකම් ඇති සහ ගිණුම්කරණය සහ/හෝ විගණනය පිළිබඳ පළපුරුද්ද ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය."***
එබැවින්, ඉහත කී සංශෝධනය බැංකු පනතේ විධිවිධානවල දක්වා ඇති අවශ්‍යතා සපුරාලනු ඇත.
තවද, ලංකා බැංකුවේ සභාපතිවරයා විසින් ඉහත යෝජනා ඇතුළත් පිළිතුර 2021.05.28 දින භාණ්ඩාගාර ලේකම්වරයා වෙත යොමු කර ඇත.
තවද, 2021.11.10 වන දින ලංකා බැංකුවේ නීති

දෙපාර්තමේන්තුව විසින් කරන ලද විමසීමකට පිළිතුරු දෙමින් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (නීති) විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කිරීමට ලංකා බැංකු ආඥාපනතට යෝජිත සියලුම සංශෝධන ඇතුළත් කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් සිටින බව පැවසීය.

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------ | ----------- |

(i) පසුගිය වසර තුනක කාලය තුළ බැංකුව විවිධ අංශ සඳහා ලබා දී ඇති ණය මත ගණනය කරන ලද අක්‍රීය අනුපාතය පහත වගුවේ දක්වා ඇත. පසුගිය වසර තුනක කාලය තුළ නිෂ්පාදන, ඉදිකිරීම්, සෞඛ්‍ය සේවා, සමාජ සේවා සහ උපකාරක සේවා සහ පරිභෝජනය යන අංශවල අක්‍රීය අනුපාත ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය විය.

| අංශය<br>------ | 2018<br>----- | | 2019<br>------ | | 2020<br>------- | |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | % | රු.මිලියන | % | රු.මිලියන | % |
| කෘෂිකර්මය, වන විද්‍යාව සහ ධීවර | 10,879.17 | 20.24 | 18,486.70 | 23.97 | 17,877.50 | 12.96 |
| නිෂ්පාදනය | 10,034.85 | 18.67 | 13,222.64 | 17.14 | 27,767.11 | 20.13 |
| සංචාරක | 2,330.36 | 4.34 | 3,902.11 | 5.06 | 5,418.22 | 3.93 |
| ප්‍රවාහනය සහ ගබඩා කිරීම | 668.47 | 1.24 | 802.75 | 1.04 | 1,446.82 | 1.05 |
| ඉදිකිරීම | 4,615.41 | 8.59 | 10,201.13 | 13.23 | 18,488.91 | 13.40 |
| යටිතල පහසුකම් සංවර්ධනය | 1,921.91 | 3.58 | 2,418.21 | 3.14 | 4,137.09 | 3.00 |
| තොග සහ සිල්ලර වෙළඳාම | 11,309.35 | 21.04 | 14,698.53 | 19.06 | 28,865.15 | 20.93 |
| තොරතුරු තාක්ෂණය සහ සන්නිවේදන සේවා | 995.48 | 1.85 | 1,034.95 | 1.34 | 1,391.59 | 1.01 |
| මූල්‍ය සේවා | 189.46 | 0.35 | 654.23 | 0.85 | 995.79 | 0.72 |
| වෘත්තීය, විද්‍යාත්මක සහ තාක්ෂණික ක්‍රියාකාරකම් | 107.96 | 0.20 | 125.41 | 0.16 | 216.49 | 0.16 |
| කලා, විනෝදාස්වාදය සහ විනෝදය | 597.28 | 1.11 | 65.78 | 0.09 | 151.09 | 0.11 |

කොවිඩ් **19** වසංගතය සහ ඒ ආශ්‍රිත සීමාවන්, නිෂ්පාදන, ඉදිකිරීම්, සෞඛ්‍ය සේවා, සමාජ සේවා සහ සහාය සේවා අංශවල අක්‍රීය ණය වැඩිවීමට සෘජුව සම්බන්ධ වන බොහෝ අංශවල ණය ගුණාත්මක භාවය පිරිහීමට හේතු වූ සෘණාත්මක බලපෑම් හේතුවෙන් 2020 මුල් භාගයේ සිට සමස්තයක් ලෙස රටේ ආර්ථිකය නරක තත්ත්වයක පවතී. වැඩි වූ විරැකියාව, අඩු වූ ආදායම පරිභෝජන කාණ්ඩයේ අක්‍රීය ණය වැඩිවීමට හේතු වී ඇත. සමස්ථ කාර්යසාධනය සලකා බැලීමේදී 2019 වසරේ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය වූ 4.79% 2020 වර්ෂයේදී 4.76% දක්වා දියුණු වී ඇත.

කර්මාන්තයේ අක්‍රීය ණය අනුපාත සහ බැංකුවේ සමස්ත අක්‍රීය ණය අනුපාතය අඩු කිරීමට ගත හැකි සෑම පියවරක්ම ගැනීමට නිර්දේශ කෙරේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| අධ්‍යාපන | 86.78 | 0.16 | 82.37 | 0.11 | 422.15 | 0.31 |
| සෞඛ්‍ය සේවා, සමාජ සේවා සහ උපකාරක සේවා | 693.85 | 1.29 | 2,373.57 | 3.08 | 9,314.01 | 6.75 |
| පරිභෝජනය | 4,573.30 | 8.51 | 4,303.57 | 5.58 | 14,350.80 | 10.40 |
| මුදල් අමාත්‍යාංශයට ණය දීම | - | - | - | - | - | - |
| විදේශීය ආයතන සඳහා ණය දීම දීම | 4,750.46 | 8.84 | 4,761.06 | 6.17 | 7,094.51 | 5.14 |

2021, 3 වැනි කාර්තුවේ සිට ආර්ථික කටයුතු නැවත ආරම්භ වීමත් සමඟ විශේෂිත අංශවල අනුපාත ද පෙර වසංගත මට්ටම් කරා ආපසු යාමට අපේක්ෂා කෙරේ. බැංකුවේ අක්‍රීය ණය අඩු කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග ගනු ලැබේ.

- සතිපතා සී.එෆ්.ඕ විසින් මෙහෙයවන අක්‍රීය ණය සමාලෝචන කමිටු රැස්වීම්. එය ආයතනික සහ පළාත් කොටස්වල අක්‍රීය ණය පහසුකම් ආවරණය කරයි.

- බී.පී.ආර්.යු ප්‍රතිසාධන පළාත් අංශයේ පිහිටුවා ඇත.

ඩී.ජී.එම් ප්‍රතිසාධනය (ආයතනික) සමඟ පවත්නා අක්‍රීය ණය/ නිරීක්ෂණ ලැයිස්තු ගණුදෙනුකරුවන් සම්බන්ධයෙන් එක් එක් සම්බන්ධතා නිලධාරියා සමඟ තනි පුද්ගල සාකච්ඡා සිදුකරමින් පවතී.

(ii) පසුගිය වසර තුනක කාලසීමාව තුළ බැංකුවේ III වන අදියර හානිකරණ වූ ණය අනුපාතය සහ දළ අක්‍රීය ණය අනුපාතය පහත වගුවේ දැක්වේ. III වන අදියරේ හානිකරණ වූ ණය, බැංකුවේ නියාමන අක්‍රීය ණය අනුපාතයට වඩා වැඩි අක්‍රීය ණය අනුපාතයක් ගෙන ඇත.

නිරීක්ෂණය සටහන් කර ගන්නා ලදී.
නියාමන අක්‍රීය ණය, හිඟ අත්තිකාරම්වල ගෙවී ගිය හිඟ දින ගණන පදනම් කර ගෙන හඳුනා ගනී.
හානිකරණය වූ ණය

බැංකුවේ III වන අදියර හානිකරණය වූ ණය අනුපාත අඩු කිරීම සඳහා සතුටුදායක ක්‍රියාමාර්ග ගැනීමට

| විස්තරය | දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | 2020 | 2019 | 2018 |
| දළ ණය සහ අත්තිකාරම් | 2,115,204,744 | 1,648,760,589 | 1,510,534,078 |
| III වන අදියර ණය සහ අත්තිකාරම් | 207,523,942 | 166,687,234 | 137,215,336 |
| දළ ණය සහ අත්තිකාරම් වලින් III අදියර ණය % | 9.81 | 10.11 | 9.08 |
| අක්‍රීය අත්තිකාරම් | 98,564,000 | 77,133,000 | 53,754,000 |
| දළ අක්‍රීය අත්තිකාරම් අනුපාතය (%) | 4.8 | 4.8 | 3.6 |

හඳුනා ගැනීමේදී හිඟ අත්තිකාරම්වල ගෙවී ගිය හිඟ දින ගණන පමණක් නොව අත්තිකාරම් හානිකරණය වීමට බලපාන වෙනත් අදාළ සාධක බොහෝමයක් සලකා බලනු ලැබේ.

නිර්දේශ කෙරේ.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2020 වර්ෂය සඳහා බැංකුවේ අනුමත කාර්ය මණ්ඩලය සේවකයින් 10,356ක් වූ අතර, එදිනට තත්‍ය සේවක සංඛ්‍යාව 9,927ක් වූ අතර එය ස්ථිර කාර්ය මණ්ඩලය 8,477 කින් සහ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් 1,450 කින් සමන්විත වේ. ඒ අනුව, 2020 දෙසැම්බර් 31 වන දිනට තනතුරු 429 ක් පුරප්පාඩු වී ඇත.<br><br>(ii) ආයතනික මට්ටමින් පුරප්පාඩු 2 කින්, විධායක මට්ටමින් පුරප්පාඩු 3 කින් සහ මෙහෙයුම් මට්ටමින් පුරප්පාඩු 424 කින් සම්පූර්ණ පුරප්පාඩු 429 සමන්විත වේ. | බී.ඕ.ඩී අනුමැතිය ඇතිව බැංකුව පුරප්පාඩු වූ තනතුරු වරින් වර පුරවයි. පුරප්පාඩු වී ඇති තනතුරු සංඛ්‍යාව හැර උසස්වීම් සහ බඳවා ගැනීම් සඳහා කැඳවීමේදී අනාගත බඳවා ගැනීමේ ප්‍රක්ෂේපන, ප්‍රමාණවත් තරම් සුදුසුකම් ලත් අපේක්ෂකයින් සිටීම යනාදිය අප විසින් සලකා බලයි.<br>බැංකුව විසින් 2021 දී ආයතනික මට්ටමින් පුරප්පාඩු 2 ක් සහ විධායක මට්ටමෙන් පුරප්පාඩු 3 ක් පුරවා ඇති අතර මෙහෙයුම් මට්ටමේ පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ අභ්‍යාසලාභීන් සහ අභ්‍යාසලාභී මාණ්ඩලික සහකාරවරුන් බඳවා ගැනීම සඳහා දැනටමත් අයදුම්පත් කැඳවා ඇත. | බැංකුවේ කටයුතු සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |